හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

15 MAR 2011

වාර්ෂික වාර්තාව
2006

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.
ශ්‍රී ලංකාව.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

වාර්ෂික වාර්තාව
2006

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.
ශ්‍රී ලංකාව.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 07.
2007.ජුනි 27

ගරු කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යතුමා,
කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඇමතිතුමනි,

2006 වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම්

1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය පරිදි 2006 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් ලේඛනය ආයතනයේ පාලක මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

1. වාර්ෂික වාර්තාව
2. විගණනය කරන ලද ආදායම් හා වියදම් ගිණුම්
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ නිරීක්ෂණය

මෙයට - විශ්වාසී,

තිස්ස වර්ණසූරිය
සභාපති,
පාලක මණ්ඩලය.

2006 වාර්ෂික වාර්තාව

2006 වසරේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් දියත් කරන ලද විවිධ කාර්යයන් පිළිබඳ සටහනක් හා විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්ෂික වාර්තාව මඟින් ඉදිරිපත් කෙරේ. අදාල වර්ෂය තුළ වැදගත් කාර්ය භාරයන් රැසක් ඉටු කෙරුණි. අපගේ සාර්ථකත්වය සම්බන්ධයෙන් අප අභිමානයට පත් වන අතර, ඊට ඉවහල් වූයේ ආයතන කාර්ය මණ්ඩලයේ අප්‍රතිහත කැපවීම හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ නොමසුරු සහාය බැව් මතකයේ රඳවමු.

2002 - 2006 සංයුක්ත සැලැස්ම මඟින් ආයතනයේ ක්‍රියාකාරී වැඩසටහන පෙන්වාදී ඇති අතර, විවිධ වූ කාර්යයන් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය හා අනෙකුත් සම්පත් පිළිබඳ විග්‍රහයක්ද ඉදිරිපත් කෙරේ. ආයතනයේ ඵලදායිතාව දියුණු කිරීමට අවශ්‍ය මූලික පියවර වනුයේ දැනට අනුමත මට්ටමේ ස්ථායි ප්‍රවීණ කාර්ය මණ්ඩලයක් වුවත් ඊට සරිලන ඉහල වැටුප් ව්‍යුහයක් ලැබෙන තෙක් මෙය ඉටු කර ගැනීමට අපහසු වේ. පිළිගත් මට්ටමේ සේවා තත්ත්වයක් සැපයීම සඳහා ඉවහල් වන මානව හා අනෙකුත් සම්පත් ආයතනයේ ඇත්තේ අවශ්‍යතාවයට වඩා බොහෝ මඳ වශයෙනි.

පර්යේෂකයකු ඉටු කරන රාජකාරී, ව්‍යාපෘති හා අනෙකුත් කාර්යයන් එකට ගොනු කිරීමෙන් මෙම කාර්ය භාරය නිම කිරීමට ගත වන වෘත්තිය කාර්ය මණ්ඩල කාලය ගැන පැහැදිළි අවබෝධයක් නොලැබෙන හෙයින් වෘත්තිය කාර්ය භාරය මැනීම ඉතා අසීරුය. වෘත්තිය කාර්ය භාරය ස්වභාවයෙන්ම වෘත්තිකයන් මුහුණ පාන විවිධ අවස්ථා අනුව වෙනස් වේ. වෘත්තිමය කාර්ය භාරය මැනීමේදී වෘත්තියමය කාර්යක්ෂමතාවය තක්සේරුව පිළිබඳ ගැටළු ඇති වේ. කාර්යක්ෂමතාවයේ මිනුම කාර්ය භාරය සඳහා වලංගු මිණුම් මත රඳා පවතී.

වෙළඳපළ මත රඳා පවතින ආර්ථිකයක් වශයෙන් හැඳින්වෙන්නේ කිසියම් මිලදී ගැනීමේ හැකියාවක් ඇති ජනතාව වෙනුවෙන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයයි. වෙළඳපොළ මූලික ප්‍රවේශය මඟින් පාරිභෝජනය ප්‍රවර්ධනය කරන හෙයින් ව්‍යුහාත්මක සැකසීම් වැඩසටහන් මඟින් මෙම තත්ත්වය තවත් උග්‍ර කෙරේ. මේ අනුව ශ්‍රී ලංකාවේ, ජනගහනයෙන් හතරෙන් එකක් තවමත් දරිද්‍රතාවයේ කිඳා බැස සිටින අවධියකදී "වෙළඳපොළ මූලික ප්‍රවේශය" මඟින් ඉටු කෙරෙනුයේ උදාහරණයක් වශයෙන් පොදු සන්නිවේදන පද්ධති දියුණු කිරීම වෙනුවට වඩා උසස් තත්ත්වයේ ජංගම දුරකථන අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමත්, සුරක්ෂිත පානීය ජලය වෙනුවට අධික ලෙස සිසිල් බීම වර්ග නිපදවීමත්ය.

මේ අතර ග්‍රාමීය දරිද්‍රතාවය අවසන් කිරීමට අප මෙතෙක් සමත්වී නොමැති අතර, මෙය නොයෙකුත් අන්දමේ පාරිසරික ආතති ඇති කිරීමට යොමුවී ඇත. බොහොමයක් ග්‍රාමීය ප්‍රජාවල ජීවත්වීමේ හැකියාව රඳා පවතින්නේ ඔවුන්ගේ සාම්ප්‍රදායික දැනුම හා ප්‍රායෝගිකත්වය මතය. උදාහරණ වශයෙන් ග්‍රාමීය ගොවියන් තමා ඇති කරන සතුන් උදෙසා තණබිම් හා වගාවන් මාරු කිරීමේ ක්‍රමය දැක්විය හැකි ය. තිරසාර ජීවන රටාවක් කෙරෙහි යොමු වීම උදෙසා මහා පරිමාණයේ අධ්‍යාපන, පුහුණු හා දැනුවත්වීමේ වැඩසටහන් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ විවිධ තොග වෙළඳපොළවල් අතර මිල ගණන් තොරතුරු හුවමාරුවක් තවමත් සිදු නොවේ. මේ නිසා එක් එක් වෙළඳපොළේ හිඟ නිෂ්පාදන හඳුනාගැනීම අපහසු වන අතර, ගොවියන් හා ප්‍රවාහන කරුවන්ට වැඩි ම මිලක් ලබාගත හැකි වෙළඳපොළක් කරා නිෂ්පාදන ගෙන යාමට හැකි ඉක්මන් ප්‍රවේශයක් සහිත මිල තොරතුරු නොමැති වීම මඟින් අතරමැදියනට එක් වෙළඳපොළක සිට තවෙකකට මාරු කිරීමෙන් උපරිම ලාභයක් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙයි. මේ අනුව අනවශ්‍ය ප්‍රවාහන වියදමක් දැරීමට සිදු වේ. අකාර්යක්ෂම බෙදා හැරීම් පද්ධතිය හේතුවෙන් පැන නගින මෙම අමතර වියදම අවසානයේදී දරන්නේ පාරිභෝගිකයන්ය. ගොවීන්ට මිල තොරතුරු ලබා දීමෙන් බෙදාහැරීම් ක්‍රියාවලියේ පවතින මිල ගණන් සාකච්ඡා කිරීම මඟින් තීරණයකට එළැඹීමේ ඇති පොදු දුර්වලතාවය මගහරවා ගැනීමට මඟපාදා දෙයි. දිනපතා සහ සතිපතා ආහාර ද්‍රව්‍ය මිල ගණන් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් විසුරුවා හැරේ. සතිපතා මිල ගණන් අප ආයතනයේ වෙබ් අඩවියේ (www.harti.lk) දක්වා ඇත. ප්‍රධාන කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය පිළිබඳ මිල ගණන්වල ඉහළ පහළ යාම පැහැදිලි කිරීම පමණක් නොව එම පැවතුම් සඳහා හේතු දක්වමින් අප සංකීර්ණ තත්ත්වයන් ලිහිල්ව ඉදිරිපත් කිරීමට උත්සාහ දරනු ලැබේ.

ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි කැප වුනු ආයතනයක් ලෙස හා ප්‍රතිපත්ති සම්පාදනය වෙනුවෙන් සිතීමට යොමු වුන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය දැනට සංවර්ධනය සඳහා වෙනස් වෙමින් පවතින පරිසරයක තම කාර්යයන් හා මූලික අරමුණ නැවත හඳුනා ගැනීමේ උත්සාහයක යෙදේ. ග්‍රාමීය සංවර්ධනය හා දරිද්‍රතාවය තුරන් කිරීමේලා ආයතනය සතු ප්‍රධාන

කාර්යයට උර දෙන අතර රටේ ප්‍රමුඛතා උපායමාර්ග හා අවශ්‍යතා අනුව නැවත හැඩ ගැසීමට උත්සාහ දරා ඇත.

අදාළ පාර්ශවකරුවන්ගේ උපදේශන සාකච්ඡා කැඳවීම් පැවැත්වීම මඟින් අප ආයතනය සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ මූලිකත්වය ගෙන ක්‍රියා කර ඇත. ආයතනයේ පර්යේෂණයන් හැකිතාක් දුරට ක්‍රියාකාරී මුහුණුවරකින් දියත් කිරීමට අප උත්සාහ දරා ඇත. උදාහරණයක් වශයෙන් ගොවියන් හා අදාළ ජාතික ආයතන පොහොර බෙදාහැරීමේ වැඩසටහනේදී මුහුණ දෙන ගැටළු හා අවහිරතා හඳුනා ගෙන ගොවියනට හිතකර අන්දමේ පොහොර ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම සඳහා එම වැඩසටහන පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීමට වැඩ මුළුවක් පවත්වන ලදී. මෙහිදී පොහොර බෙදා හැරීමේ වැඩසටහන වැඩි දියුණු කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයක් නිර්දේශ වුණි.

ආයතනය මඟින් 2006 දී ආරම්භ කළ එක් ක්‍රියාමාර්ගයක් වූයේ, කෘෂිකාර්මික ක්‍රියාවලියන් සඳහා සහභාගිත්ව ගැමි විමසුම් ක්‍රමවේදය (PRA) පිළිබඳ වැඩමුළු ගණනාවක් පැවැත්වීමයි. "ගම නැඟුම" නමින් කෙරෙන ග්‍රාමීය තත්ත්වයන් ඉහළ නැංවීමේ වැඩසටහන මඟින් රටේ සියළුම ගම්මාන, වර්ධනයේ ක්ෂුද්‍ර මධ්‍යස්ථාන බවට ප්‍රතිස්ථාපනය කිරීමක් සිදු වේ. මෙම ඉලක්ක ගම්මාන සැලසුම් කිරීමේදී ගැමි ජනතාව විසින් සහභාගිත්ව ක්‍රමවේදය මත පදනම් වූ ප්‍රජා ක්‍රියාකාරී වැඩසටහන් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. ප්‍රජා සංවර්ධනයේ කඩිනම් ගැමි විමසුම / සහභාගිත්ව ගැමි විමසුම් (RRA/PRA) සහ චක්‍රීය ව්‍යාපෘති කළමනාකරණය (PCM) යන සහභාගිත්ව ශිල්පීය ක්‍රම කෘෂිකාර්මික ක්‍රියාවලියන් සඳහා යොදා ගැනීමේ හැකියාවන් වැඩිදියුණු කිරීමට පුහුණුකරුවන් විසින් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් ප්‍රයත්න දරා ඇත. ගම නැගුම වැඩ සටහන යටතේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පහසුකම් සපයන්නවුන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා සූදානමින් සිටී.

ආයතනයේ කාර්ය භාරයේ ප්‍රධාන අරමුණක් වනුයේ සමාජ ආර්ථික පර්යේෂණ හා ප්‍රතිපත්ති සම්පාදනය එක්තැන් කිරීමයි. ඒ සඳහා ආයතනය පිහිටුවා ඇති 1972 අංක 05 පනත ඉවහල් කොට ගනී. ග්‍රාමීය සංවර්ධනය සඳහා ගොවිජන හා දරිද්‍රතාවයේ කරුණු විද්‍යාත්මක හා ශිල්පීය විශ්ලේෂණ ක්‍රම යොදා ගැනීමක් මෙහිදී සිදු වේ. රජයේ ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවශ්‍ය විස්තරාත්මක දැනුම උපායමාර්ග විකල්ප සඳහා ලබා දෙමින් විවිධ ප්‍රතිපත්තිවල බලපෑම් තක්සේරු කිරීමක් සිදු වේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්ය භාරය හා රාජකාරී පිළිබඳ වඩාත් පැහැදිලි වැටහීමක් පාඨකයන්ට ඉදිරි පිටු පරිශීලනයේදී ලැබෙනු ඇතැයි මම විශ්වාස කරමි.

වී.කේ. නානායක්කාර
අධ්‍යක්ෂ.

පාලක මණ්ඩලය

තිස්ස වර්ණසූරිය මහතා	-	පාලක මණ්ඩලයේ සභාපති හා කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
වී.කේ. නානායක්කාර මහතා	-	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ
ඩබ්.එම්. ජයතිලක මහතා	-	කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
ජී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා	-	මුදල් අමාත්‍යාංශයේ, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ
බිම්බා ගුණතිලක මහත්මිය	-	ප්‍රදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ
සී.පී. සිරිවර්ධන මහතා	-	ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මාලනී පීරිස් මහත්මිය	-	අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම්
එම්. වීරසිංහ මහතා	-	මහවැලි සහ ගංගාධාර සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන)
සෑම් එදිරිසූරිය මහතා	-	වෙළඳ වාණිජ සහ පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන)
කේ.එල්. ද සිල්වා මහතා	-	ශ්‍රී ලංකා මහ බැංකුවේ කෘෂිකර්ම අංශයේ ප්‍රධාන හා ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ
මහාචාර්ය බුද්ධි මාරඹේ	-	පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති
ආචාර්ය සී. කුඩාගමගේ	-	කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල්
එස්.ඩී.ජී.බී. බොරලැස්ස මහතා	-	ඉඩම් කොමසාරිස් ජෙනරාල්
ඩී.ඩී. වනිගනායක මහතා	-	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල්
බී.එම්.එස්. සමරසේකර මහතා	-	වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල්
පෝටේ වුම්ශ්‍රී මහතා	-	ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ නේවාසික නියෝජිත
ආර්.ද. සිල්වා මහත්මිය	-	පාලක මණ්ඩල ලේකම්

පාලක මණ්ඩලය (වසර තුළ දී සිදු වූ වෙනස්කම්)

2006 වසර තුළදී පාලක මණ්ඩලයේ සංයුතියෙහි පහත සඳහන් වෙනස්කම් සිදු විය.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ.පී. ඉන්ද්‍රන් මහතාගේ පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් විය.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ පී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් පාලක මණ්ඩල සාමාජිකත්වයට පත් විය.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) ඉන්ද්‍රානි සුගතදාස මහත්මියගේ පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් විය.

වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්.එම්.කේ.ආර්. බාලචන්ද්‍ර මහත්මියගේ පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් විය.

වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සෑම් එදිරිසූරිය මහතා එම අමාත්‍යාංශයේ නියෝජිත ලෙස පාලක මණ්ඩල සාමාජිකත්වයට පත් විය.

පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ පළාත් සංවර්ධන අධ්‍යක්ෂිකා බිම්බා ගුණතිලක මහත්මිය එම අමාත්‍යාංශය නියෝජනය කරමින් පාලක මණ්ඩලයට එක් වූවාය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති මහාචාර්ය බුද්ධි මාරඹේ මහතා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් පාලක මණ්ඩල සාමාජිකත්වයට පත් විය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස කටයුතු කරමින් සිටියදී ජිවිතයෙන් සමුගත් කේ.එස්.ආර්. ද සිල්වා මහතාගේ පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් විය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස පත්වූ බී.එම්.එස්. සමරසේකර මහතා පාලක මණ්ඩල සාමාජිකත්වයට පත්විය.

ගොවිජන සේවා කොමසාරිස් ලූකස් ඉඳුරුගල්ල මහතා එම තනතුරෙන් ඉවත් වීමෙන් පසු පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් විය. ඔහුගේ අනුප්‍රාප්තික ඩී.ඩී. වනිගනායක මහතා පාලක මණ්ඩල සාමාජිකත්වයට පත්විය.

ඉඩම් කොමසාරිස් එස්.ජේ. පතිරණ මහතා එම තනතුරෙන් ඉවත් වීමෙන් පසු පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් විය. ඔහුගේ අනුප්‍රාප්තික එස්.ඩී.ඒ.බී. බොරලැස්ස මහතා පාලක මණ්ඩල සාමාජිකත්වයට පත්විය.

සමුපකාර සංවර්ධන කොමසාරිස් ජෙනරාල් එච්.එල්. තිසේරා මහතාගේ පාලක මණ්ඩල සාමාජිකත්වය අවසන් විය.

කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

අවසන් කරන ලද අධ්‍යයනයන්

1. ගම නැගුම වැඩසටහන යටතේ ආදර්ශන ලෙස දියුණු කිරීම සඳහා තෝරා ගන්නා ලද ගම් දහය සඳහා වූ පූර්ව ව්‍යාපෘති සමාජ - ආර්ථික සමීක්ෂණය

පර්යේෂණ කණ්ඩායම

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා	-	අංශ ප්‍රධාන
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එන්.පී.ජී. සමන්ත මහතා	-	පර්යේෂණ නිලධාරී
ඩබ්ලිව්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා	-	පර්යේෂණ නිලධාරී
සාගරිකා හිටිහාමු මෙනවිය	-	පර්යේෂණ නිලධාරිණී
එස්.ආර්. බණ්ඩාර මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී
චතුර ජයම්පති ද සිල්වා මහතා	-	පර්යේෂණ නිලධාරී
ආර්.එම්.පී.කේ.බී. රත්නායක මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
ඩබ්ලිව්.එච්.ඒ. ශාන්ත මහතා	-	පර්යේෂණ නිලධාරී
එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	පර්යේෂණ නිලධාරී

වර්තමාන රජය විසින් "මහින්ද චින්තන" ප්‍රතිපත්ති රාමුව යටතේ ආරම්භ කර ඇති ගම නැගුම වැඩසටහන දුප්පත්කම නැති කිරීම සඳහා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශය පෙරටු කොටගෙන ක්‍රියාත්මක වන්නකි. "ගම නැගුම" සංකල්පයෙහි මූලික අදහස වන්නේ, සංවර්ධනය සඳහා වූ සැලසුම් සැකසීම මෙන්ම, ඒවා ක්‍රියාත්මක කිරීමේ කටයුත්තේ දී ගමෙහි මිනිසුන් පාර්ශ්වකරුවන් බවට පත් කරගැනීමය. මෙම වැඩසටහනෙහි "දැක්ම" වන්නේ ගම ජාතික සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය බවට පත් කර ගැනීමය. මෙහෙවර වන්නේ ගැමියන්ගේ ඉහළ මට්ටමේ සහභාගිත්වය ඇතිව අඩු දියුණු මට්ටමේ ගම් දියුණු කිරීම සඳහා විවිධ සංවර්ධන උත්සාහයන් ගම වෙත සම්බන්ධ කිරීමය. ගම නැගුම වැඩසටහනෙහි අරමුණු වන්නේ (i) ගමෙහි මිනිසුන් සංවර්ධනයෙහි ඉලක්ක පමණක් නොව පාර්ශ්වකරුවන් බවට පත් කරගැනීම, (ii) මිනිසුන් විසින් ගමෙහි ප්‍රශ්න මෙන්ම සංවර්ධන විභවතා හඳුනාගැනීම සහ සංවර්ධනයෙහි පෙර ගමන්කරුවන් ලෙස ඔවුන් විසින් ගමෙහි සංවර්ධනය ආරම්භ කිරීම, (iii) වඩාත් ඉහළ කළමනාකරණ තත්ත්වයක් යටතේ අභ්‍යන්තර මෙන්ම බාහිර සම්පත් වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීම, (iv) ග්‍රාමීය දරිද්‍රතාව අවමකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම. ගම නැගුම වැඩසටහනෙහි ප්‍රථම පියවර වශයෙන් රජය ආදර්ශ ලෙස සංවර්ධනය කිරීමට ගම්මාන 10 ක් තෝරාගෙන තිබේ.

සමීක්ෂණයෙහි අරමුණු

ගම නැගුම ආදර්ශන ලෙස තෝරාගත් ගම්වල ක්‍රියාත්මක වනු ලබන මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයෙහි මූලික අරමුණ වන්නේ එම ගම්වල සිදු කරනු ලබන ව්‍යාපෘති මැදිහත්වීම්වල බලපෑම පසු ඇගයුමට ලක් කිරීමට හැකිවනු පිණිස වර්තමානයෙහි පවත්නා සමාජ, ආර්ථික තත්ත්වයට අදාළ දත්ත රැස් කරමින් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමය.

අධ්‍යයන ගම්මාන

අදාළ ආදර්ශ ගම්මාන පිහිටා ඇති දිස්ත්‍රික්ක දහයක අධ්‍යයනය ක්‍රියාත්මක විය. එම දිස්ත්‍රික්ක හා ගම්මාන පහත සඳහන් පරිදි වේ. මොණරාගල - හත කොටස ජයමිණි ගම, බදුල්ල - ඇටඹේවෙල කනුගොල්ල ගම, පුත්තලම - කොම්බුවට්ටාන්, හම්බන්තොට - බැදිගම්තොට, නුවර - මිනිජේ, කෑගල්ල - වත්තේගෙදරගම, මාතලේ - සිරංගහවත්ත ගම, අනුරාධපුර - බිසෝ කොටුව එකේ කණුව ගම, රත්නපුර -කඩුහේන්තැන්න හේන් යාය, නුවරඑළිය - හප්පාවර

අදාළ ගම්මාන තුල සිදු කළ සමීක්ෂණ කටයුතු නිම කළ අතර, ඒ ඒ ගම සඳහා ඒවායෙහි සමාජ ආර්ථික තත්ත්වය, විවිධ වූ ප්‍රශ්න සහ අනාගත සංවර්ධන විභවතාවන් යන කරුණු අඩංගු කරමින්, වාර්තාව බැගින් සකස් කරනු ලැබිණ.

2. දේශීය කෘෂිකර්මය ආශ්‍රිත ශ්‍රම වෙළඳපළෙහි මෑතකාලීන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම :	ආචාර්ය ජී.එම්. හේනෙගෙදර මහතා	-	අධි පර්යේෂක
	ටී. රවිචන්ද්‍රන් මහතා	-	සහාය අධි පර්යේෂක
දත්ත විශ්ලේෂක :	ආනන්ද සිල්වා මහතා	-	ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී

ක්ෂේත්‍රය	:	හිඟුරක්ගොඩ, රඹුක්කන, පල්ලෙපොල, වැලිමඩ, උඩුදුම්බර සහ ගලෙන්බිඳුනුවැව
මූල්‍ය සහාය	:	කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
මුදල	:	රු.556,250.00

වී වගාව ප්‍රමුඛ ආහාර භෝග ආශ්‍රිත ශ්‍රම වෙළඳපළෙහි මෑතකාලීන වෙනස්කම් සොයා බැලීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ විය. මෙහිදී දේශීය සහ ගෝලීය ආර්ථික රාමුව තුල ශ්‍රම භාවිතය, ශ්‍රම ඵලදායිතාවය සහ ශ්‍රම සංචලනය කෙරෙහි ශ්‍රම වෙළඳපළෙහි නව නැඹියාවන් පිළිබඳව අධ්‍යයනය කිරීම හා ශ්‍රම ඵලදායිතාවය, කාර්යක්ෂමතාවය, වේතන සහ ශ්‍රම විස්ථාපනය සම්බන්ධව එහි ඉල්ලුම් සහ සැපයුමේ තත්ත්වයන් අනුව විග්‍රහ කිරීමට ද අපේක්ෂිතය. වාරි සහ ජල පෝෂිත ක්‍රම යටතේ වී, එළවළු, කුරක්කන් සහ බඩඉරිඟු වගා කරන දිස්ත්‍රික්කයන් හතරක් අධ්‍යයනයෙහිදී සැලකිල්ලට ගෙන ඇත.

වගා කිරීමේදී ශ්‍රමය වෙනුවට ශ්‍රම ඉතුරුම් ක්‍රම ලෙස යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමත් සමඟ ශ්‍රම භාවිතයෙහි අඩු වීමක් ඇති බව මෙම අධ්‍යයනයෙන් හෙළි වී ඇති අතර ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රමිකයන් කෘෂිකර්මාන්තයෙන් ඈත් වී නගරයේ කර්මාන්ත සහ සේවා අංශයන් කෙරෙහි යොමු වීමක්ද පෙනේ. පළපුරුද්ද, ස්ත්‍රී/පුරුෂභාවය, වගාව පිළිබඳ දැනුම, කාර්යක්ෂමභාවය, අවංක බව සහ වයස වැනි විශේෂිත වූ සාධක මත ශ්‍රම ඉල්ලුම තීරණය වූ නමුත්, ශ්‍රම සැපයුම පවුලේ සහ හුවමාරු ශ්‍රමය ලබා දීමේ හැකියාව මත රඳා පවතී. මෙහිදී ඉහත කී ගුණාංග සැලකිල්ලට ගැනීම නිසා නුපුහුණු ශ්‍රමිකයන්ට වඩා ඉහළ වේතන පුහුණු ශ්‍රමිකයන්ට හිමිවේ. එළවළු සහ බඩඉරිඟු යන භෝගයන් සඳහා වර්ෂා පෝෂිත ක්‍රමයට වඩා වාරි ජල ආශ්‍රිත වගාවන්හිදී ශ්‍රම ඵලදායිතාව වඩාත් ඉහළ මට්ටමක පවතී. එයට හේතුව වන්නේ වාරි ජලය යටතේ වගා කරන ප්‍රදේශයන්හි ශ්‍රම ඉතුරුම් ක්‍රම අනුගමනය කරන අතර එමගින් ඉහළ අස්වැන්නක්ද ලබා ගත හැකි වීමයි.

මෙහිදී ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කළ යුතු සාධක හයක් හඳුනා ගැනුණි. වී වගාව සඳහා වූ ශ්‍රමිකයන් අඩු වීම, ශ්‍රම සැපයුමේ ස්වරූපය වෙනස් වීම, නව තාක්ෂණය සහ නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතයට ඇති නැඹියාව, කෘෂි වේතන වැඩි වීම, වගාවන් හා සම්බන්ධ වූ සංස්කෘතික හා ඇගයුම් තත්ත්වයන් වෙනස් වීම සහ ශ්‍රම සංක්‍රමණය ඉහළ යාම යනාදී කරුණු මෙහිදී වැදගත්ය. ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් සාර්ව සහ සූක්ෂ්ම මට්ටමින් සලකා බැලිය යුතු ප්‍රතිපත්ති නිර්දේශයන් කිහිපයක් මෙහිදී සැලකිල්ලට ගෙන ඇති අතර, පුහුණු කිරීම්, හැකියාවන් ප්‍රගුණ කිරීම සහ සහාය සේවා ප්‍රවර්ධනය වැනි කටයුතු කිරීම වඩාත් ඉහළ තත්ත්වයන් කරා ළඟා වීම සඳහා නිර්දේශ කර ඇත.

දැනට ක්‍රියාත්මක අධ්‍යයන

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට බලය විමධ්‍යගත කිරීම බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය.

පර්යේෂණ කණ්ඩායම :

එම්.කේ. නදීකා දමයන්ති මෙනෙවිය	-	පර්යේෂණ නිලධාරිණී
ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා	-	පර්යේෂණ නිලධාරී
වී.කේ. නානායක්කාර මහතා	-	අධ්‍යක්ෂ /හෙ.කො.ගො.ප.පු. ආයතනය
සුසිලා ලූර්දු මහත්මිය	-	පර්යේෂණ නිලධාරිණී

අධ්‍යයනයේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

(i) මධ්‍යම රජය සහ පළාත් සභා අතර ක්‍රියාකාරීත්වය/විෂයයන්/ආයතනවල අනුකූලතාව විමර්ශනය කිරීම
(ii) පළාත් සභාවල වගකීම් සහ කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය කිරීම.
(iii) ඉඩම්, වාරිමාර්ග, යටිතල පහසුකම්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ ව්‍යාප්ති සේවයට සම්බන්ධිත ගැටලු විසඳීමේ දී පළාත් සභාවල සඵලතාව පිළිබඳ ඇගයීම.
(iv) පළාත් සභාවල කාර්ය සාධනය සඳහා බලපෑම් කරනු ලබන සාධක අධ්‍යයනය. (උදා: විමධ්‍යගත කළ

බලයේ හිඩැසක් වේද? අනුගත කිරීමේ ක්‍රියාවලිය, මධ්‍ය රජය සහ පළාත් සභා අතර ගැටුම්, මූල්‍ය සහ මානව සම්පත් ඇතුළත් සම්පත් පිළිබඳ දුෂ්කරතා)

(v) පළාත් සභාවල කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කිරීම. මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශ වශයෙන් දකුණ, ඌව සහ වයඹ පළාත් තෝරා ගන්නා ලදී. අධ්‍යයනයේ වාර්තාව 2007 වසරේ මුල් භාගය තුළ නිම කිරීමට සැලසුම්කොට ඇත.

මූලික සොයා ගැනීම්

(i) කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පළාත් සභාවලට පැවරෙන ප්‍රධාන වගකීමක් වුවද, ප්‍රාදේශීය මට්ටමේ දී ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ විශාල රික්තකයක් පවතී. ප්‍රාදේශීය මට්ටමේ ස්ථානගත කර ඇති කෘෂිකර්ම උපදේශකවරුන් දැඩි කරදර සහ අපහසුතා මධ්‍යයේ මෙම රික්තකය පිරවීමට කටයුතු කරනු ලැබුවත් එය ප්‍රමාණවත් නොවේ.

(ii) මුදල් කොමිසමෙන්, පළාත් සභා වෙත මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන විට මුදල් වර්ෂයේ අවසානය වන අතර එම මුදල් භාවිතා කිරීම සඳහා ඉතිරි වන්නේ සුළු කාල පරිච්ඡේදයකි. මෙම තත්ත්වය මත පොදුවේ පළාත් සභාවලට පවතින මූල්‍ය සම්පත් තෘප්තිමත් මට්ටමක නොවේ.

(iii) පළාත් සභා අතර පුහුණු පහසුකම් වැනි සම්පත් බෙදීයාම අසමානව සිදුවන අතර ප්‍රාදේශීය මට්ටමේ දී නිලධාරීන් අධෛර්යමත් කිරීමට එය ද හේතු වී ඇත.

කෘෂිකර්ම හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය

සම්පූර්ණයෙන් නිම කරන ලද අධ්‍යයන

1. උඩවලව වනෝද්‍යානයෙන් ගවයින් ඉවත් කිරීම හා රුහුණේ කිරිගව ගැටලුව (අදියර 1,2)

පර්යේෂණ කණ්ඩායම

සම්බන්ධීකරණ නිලධාරී	-	ආචාර්ය එම්.එස්. සේනානායක මහතා	-	අංශ ප්‍රධාන
සම පර්යේෂක	-	එස්. ඇපාසිංහ මහතා	-	පර්යේෂණ නිලධාරී

මූල්‍ය අනුග්‍රහය - ඌව සහ සබරගමු පළාත් සභා

අධ්‍යයනයේ අරමුණු

1. ජාතික වනෝද්‍යානයේ පවතින කිරිගව ගැටලුව සම්බන්ධව වර්තමාන තත්ත්වය හඳුනා ගැනීම.
2. ජාතික වනෝද්‍යානය හා වන ජීවීන් ආරක්‍ෂා කර ගැනීම සඳහා අදාල කටයුතු සම්පාදනය කිරීම
3. ජාතික වශයෙන් වැදගත් මෙම කාර්යයේදී ලබා ගන්නා නිගමන හා නිර්දේශයන් අදාල පාර්ශව වෙත ඉදිරිපත් කර ක්‍රියාත්මක කරවීමට කටයුතු සැලැස්වීම.
4. උඩවලව ප්‍රදේශයේ ජාතික මට්ටමේ ආදර්ශ තෘණ භූමියක් සැකසීමට කටයුතු සම්පාදනය කිරීම.

මේ ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන අදියරයන්

අදියර 4කින් මෙම ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් වන අතර, පළමු වටයේදී (2006) 1 වන හා 2 වන අදියරයන් ක්‍රියාත්මක වේ. තෙවන සහ සිව්වන අදියරයන් 2007 වර්ෂයේදී සිදු කෙරේ.

1 වන අදියර (2006)

1. ප්‍රදේශයේ මූලික කිරිගොවි ගැටලු හඳුනා ගැනීම.
2. විකල්ප තෘණ භූමි හඳුනා ගැනීම.
3. මේ සම්බන්ධව අදාල අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු පළාත් නිලධාරීන් සමඟ පවත්වන විශේෂ සම්මන්ත්‍රණය
4. ඉඩම් නිදහස් කර ගැනීම සඳහා ගැටලු සාකච්ඡා කිරීම හා අදාල නිලධාරීන් හා කිරිගොවි සමිති විසින් අත්සන් කළ යුතු අවබෝධතා ගිවිසුම් පිළියෙල කිරීම.
5. මෙම ගැටලුවට අදාල සියලුම රාජ්‍ය ආයතන හා නිලධාරීන් දැනුවත් කිරීම හා සියලු නිලධාරීන්ගෙන් සමන්විත ජාතික මට්ටමේ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා ගැනීම.

2 වන අදියර (2006)

ජාතික ක්‍රියාකාරී කමිටුවේ උපදෙස් අනුව පහත ක්‍රියාකාරකම් සිදු කෙරේ.

1. තෝරා ගත් තෘණභූමි සඳහා වූ ඉඩම්වල පවත්නා යටිතල පහසුකම් හඳුනා ගැනීම.
2. ගොඩනැගීමට අවශ්‍ය නව යටිතල පහසුකම් හඳුනා ගැනීම හා අවශ්‍ය කටයුතු සම්පාදනය.
3. තෘණභූමි හඳුනා ගැනීමේ හා යටිතල පහසුකම් සිදු කිරීමේ සියළු කටයුතු සම්පාදනය කර අදාල ලියකියවිලි අදාළ ආයතන වෙත ලබා දීම. ඒ අනුව අධ්‍යයනයේ 3 වන හා 4 වන අදියරයන් 2007 වසරේදී ක්‍රියාත්මක කිරීමට අදාළ අරමුදල් ලබා දීමට සබරගමුව පළාත් සභාව එකඟ වීම.

2. ගෘහස්ථ මට්ටමින් සහල් සැකසුම් කර්මාන්තයේ යෙදී සිටීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම

සම්බන්ධීකරණ නිලධාරිනී	-	ගාමිනි කුසුම් කුමාර මහත්මිය	-	සහාය අධි පර්යේෂක
සම පර්යේෂණ කණ්ඩායම	-	පී.ආර්.වීරක්කොඩි මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී
	-	එස්.ඇපාසිංහ මහතා	-	පර්යේෂණ නිලධාරී
	-	එන්.එස්.බී. ඇපාකන්ද මහතා	-	පර්යේෂණ නිලධාරී

මූල්‍ය අනුග්‍රහය - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

හැඳින්වීම

සාම්ප්‍රදායික වී තැම්බීමේ හා කෙටීමේ කාර්යයේදී හමුවන විවිධ අපහසුතාවයන් මඟහැරීම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් නව සහල් සැකසුම් තාක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. මේ නව තාක්ෂණය ඔස්සේ ඉහළ ගුණාත්මක බවකින් යුත් සහල් නිෂ්පාදනය කළ හැකිවා පමණක් නොව පාරිභෝගිකයාට පහසු මිලට සහල් මිලට ගැනීමට ද හැකියාවක් ලැබී ඇත. මෙම අධ්‍යයනය මඟින් බලාපොරොත්තු වන්නේ මෙම නව තාක්ෂණය ග්‍රාමීය ස්වයං රැකියා මාර්ගයක් වශයෙන් කොතෙක් දුරට වැදගත් වන්නේදැයි සොයා බැලීමත්, එමඟින් ග්‍රාමීය පවුල් ඒකකවල (ජනතාවගේ) ආදායමෙහි වැඩිවීමක් ඇත්දැයි සොයා බැලීමත්ය.

අධ්‍යයනයෙන් සොයා ගත් කරුණු

සමහර ප්‍රධාන සොයා ගැනීම් : මෙම තාක්ෂණය තුළින් සහල් නිෂ්පාදනය කිරීමේ දී භාවිතා කරන වී වර්ග අනුව ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකකට බෙදා වෙන්විය හැකිය. (i) තමන්ගේම වී භාවිතා කරමින් සහල් සැකසීම. (ii) වී මිලට ගෙන සහල් සැකසීම. සහල් සැකසීමේදී වැයවන සියළු වියදම් ගෙන ගණනය කළහොත් මේ ක්‍රම දෙකින්ම ලාභයක් නොලැබේ. එසේ වුවත් ශ්‍රමය හා ඉන්ධන සඳහා වියදම් හැර ගණනය කළ විට සහල් සැකසුම් තුළින් ලාභයක් ලැබිය හැකි බව අධ්‍යයනය පෙන්වා දෙයි. මෙහි සියලු ලාභය රඳා පවතින්නේ ව්‍යාපාරය සඳහා වැයවන ශ්‍රමය මත බව ඒ මඟින් තහවුරු වන්නකි.

සහල් සැකසීම ප්‍රධාන වශයෙන් ශ්‍රමය වැය වන කාර්යයකි. සමීක්ෂණයෙන් පෙන්වා දෙන පරිදි මේ සඳහා වැය වන ශ්‍රමයෙන් 99%ක්ම පවුල් ශ්‍රමය වන අතර ඉන් 62%ක්ම කාන්තා ශ්‍රමය වේ. එසේම කාන්තාවන්ගෙන් 50% ක්ම මෙම කර්මාන්තයේ යෙදී සිටියේ මූලික ආදායම් මාර්ගයක් වශයෙනි. එසේම මෙම කාන්තාවන් මෙම ව්‍යාපෘතියට ප්‍රථම රැකියා විරහිතව සිටි කාන්තාවයන්ය.

මෙම සහල් සැකසුම් කාර්යයේදී ගොවීන් මුහුණ දෙන ගැටළු ද අධ්‍යයනයේ දී සොයා බැලිනි. මෙහිදී ප්‍රධාන ගැටලුව ලෙස වාර්තා වුයේ වෙළඳපොළේ මිල උච්චාවචනය වීමයි. සහල් සැකසුම් කාර්යයේදී වී මිලට ගැනීමට සිදු වුවා නම් සහල් නිෂ්පාදන වියදම කෙරෙහි එය විශාල බලපෑමක් සිදුවූ බව සමීක්ෂණයේදී අනාවරණය විය. එය අවසානයේදී ගොවීන් ලබා ගන්නා ලාභය කෙරෙහි සෘජුවම බලපෑමක් ඇති කරයි. සැකසූ සහල් සඳහා ක්‍රමවත් වෙළඳපොළක් (වෙළඳ රටාවක්) නොවීම ද බලවත් අඩුපාඩුවක් බවට සමීක්ෂණයේදී අනාවරණය විය.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අධ්‍යයන

1. උඩවලව වනෝද්‍යානයෙන් ගවයින් ඉවත් කිරීම හා රුහුණේ කිරිගව ගැටලුව (අදියර 3 හා 4)

පර්යේෂණ කණ්ඩායම

සම්බන්ධීකරණ නිලධාරී	ආචාර්ය එම්.එස්. සේනානායක	- අංශ ප්‍රධාන
සම පර්යේෂක	එස්. ඈපාසිංහ මහතා	- පර්යේෂණ නිලධාරී
මූල්‍ය අනුග්‍රහය	ඌව සහ සබරගමු පළාත් සභා	

අධ්‍යයනයේ අරමුණු

1. ජාතික වනෝද්‍යානයේ පවතින කිරිගව ගැටලුව සම්බන්ධ වර්තමාන තත්ත්වය ඇගයීම.
2. ජාතික වනෝද්‍යානය හා තුරුලතා මෙන්ම වන ජීවීන් ආරක්ෂා කර ගැනීම සඳහා අදාළ කටයුතු සම්පාදනය කිරීම.
3. ජාතික වශයෙන් වැදගත් මෙම කාර්යයේදීත් ලබා ගන්නා නිගමන හා නිර්දේශයන් අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කර ක්‍රියාත්මක කරවීමට කටයුතු සැලැස්වීම.
4. ජාතික මට්ටමේ ආදර්ශ තෘණ භූමියක් සැකසීමට කටයුතු සම්පාදනය කිරීම.

ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන අදියරයන් ද්විත්වය

පළමු වන අදියර (2007)

1. තෘණ භූමි සකස් කිරීම හා යටිතල පහසුකම් සැකසීම පිළිබඳ අධීක්ෂණය
2. තෘණභූමි ලබා දීමට පෙර තත්ත්වය ගැන සමාජ හා ආර්ථික පර්යේෂණයක් සිදු කිරීම. එය පහත සඳහන් කරුණු යටතේ සිදු කෙරේ.

- තෘණභූමි ලබා දිය යුතු සත්ත්ව සංඛ්‍යාව හඳුනා ගැනීම.
- ගොවි ගැටලු හඳුනා ගැනීම හා අදාල ව්‍යාප්ති සේවය පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- තෘණභූමි සංවර්ධනය හා නඩත්තුව සඳහා කිරි ගොවි කමිටු පිහිටු වීම හා ඒවා අනාගතය සඳහා සංවර්ධනය කිරීම.
- පිහිටුවා ගනු ලැබූ කිරි ගොවි කමිටුවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.

3. තෘණභූමිවලට අදාළ වන පශු වෛද්‍ය කාර්යාල සමඟ විශේෂ සම්බන්ධතා ඇති කර ගැනීම.

- විධිමත් ව්‍යාප්ති සේවයක් ලබාදීම.
- තෘණ වගාවට උපදෙස් ලබා ගැනීම.
- නව වැඩිදියුණු කළ ගවයන් ලබා දීමට කටයුතු කිරීම.

2 වන අදියර (2007)

1. ක්‍රමවත් අයුරින් ගවයින් සඳහා තෘණභූමි ලබා දීම.
   - පිහිටුවන ලද ගොවි කමිටුවල නඩත්තු කටයුතු පවරා දීම හා ඒ අයගේ අනන්‍යතාවය තහවුරු කිරීම.
   - සියලු ප්‍රදේශයේ පරිසර හිතකාමී අදාළ රාජ්‍ය ආයතන දිස්ත්‍රික් මට්ටමින් කැඳවීම තුළින් එහි කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.
   - කිරි මිල දී ගැනීමේ ප්‍රමුඛත්වය දරණ මිල්කෝ වැනි ආයතන සම්බන්ධ කර ගැනීම.
   - කිරි හා සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත සුළු කර්මාන්ත ආරම්භ කිරීම.
   - කිරි ගම්මාන ව්‍යාපෘති වැඩසටහන සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
   - ප්‍රදේශයේ පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම.
2. තෘණභූමි සඳහා සියලු වැඩකටයුතු අවසන් වීමෙන් පසුව, ඒවායේ වගකීම වගකිව යුතු ආයතන වෙත භාර දීම හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ඒ වගකීම්වලින් නිදහස් වීම.

වෙනත් ක්‍රියාකාරකම්

1. රජයේ පොහොර සහනාධාරය යටතේ කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ යෝජිත පොහොර බෙදා හැරීමේ ක්‍රමවේදය (දිස්ත්‍රික් / ප්‍රාදේශීය බෙදාහැරීමේ හා ගබඩා)

පර්යේෂණ කණ්ඩායම -

ආර්.එම්.පී.කේ.බී. රත්නායක මහතා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද විශේෂ පත්‍රිකාවක් මඟින් පොහොර බෙදා හැරීම හා ගබඩා කිරීමේ පහසුකම් පිළිබඳව අධ්‍යයනයක් සිදු කොට ඒ සඳහා වඩාත් සුදුසු වැඩසටහනක් යෝජනා කරන ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලීමක් කොට ඇත. දැනට ක්‍රියාත්මක වන පොහොර බෙදා හැරීමේ යාන්ත්‍රණය ප්‍රධාන වශයෙන්ම කොළඹ කොමර්ෂල් පොහොර සමාගම හා පුද්ගලික වෙළඳුන්/නියෝජිතයින් විසින් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ වී ගොවිතැනට අවශ්‍ය පොහොර අවශ්‍යතාවයෙන් 40%ක් පමණ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් සපයනු ලබන බව එම සමාගම ප්‍රකාශ කොට සිටී. වී ගොවිතැන හා පොහොර බෙදා හැරීම සම්බන්ධව කොමර්ෂල් පොහොර සමාගම සතුව පවතින දැනුම හා අත්දැකීම් ඇතුළත්ව එම සමාගම විසින් ලබා දෙන ලද තොරතුරු සැලකිල්ලට ගෙන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ අයතනය විසින් මෙම යෝජිත යාන්ත්‍රණය පිළියෙල කොට ඇත (2006, අගෝස්තු).

2. කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවට අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා ලකුණු ක්‍රමයක්

පර්යේෂණ කණ්ඩායම

පී.ආර්. වීරක්කොඩි මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී
ආර්.එම්.පී.කේ.බී. රත්නායක මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එස්. ඈපාසිංහ මහතා	-	පර්යේෂණ නිලධාරී

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුබද්ධ කෘෂිකර්ම විද්‍යාලය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමට සුදුසු ලකුණු ක්‍රමයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සකස් කරන ලදී. දැනට පවතින ක්‍රමය අනුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ත්‍රිවිධ මාධ්‍යයන්ගෙන් ඉගැන්වෙනු ලබන අතර සෑම දිස්ත්‍රික්කයකින්ම සමාන සිසුන් සංඛ්‍යාවක් තෝරා ගනු ලැබේ. එහෙත් නව ලකුණු ක්‍රමය සැකසීමේදී එක් එක් දිස්ත්‍රික්කයන්හි සුළු ගොවි අංශයේ තත්ත්වය පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු බව කෘෂිකර්ම අමාත්‍යාංශය අවධාරණය කර ඇත. මෙම කරුණු හැරුණු කොට, සුළු ගොවි ක්ෂේත්‍රය පිළිබඳ දිගුකාලීන පර්යේෂණ දැනුම හා පළපුරුද්ද පදනම් කර ගනිමින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සුදුසු ලකුණු ක්‍රමයක් යෝජනා කර ඇත. මෙම ලකුණු ක්‍රමය ප්‍රධාන යෝජනා ක්‍රම දෙකක් යටතේ ඉදිරිපත් කර ඇත.

A යෝජනා ක්‍රමය - එක් එක් දිස්ත්‍රික්කයන්හි ජනගහණය "ආහාර අනාරක්ෂිතභාවයට ඇති ග්‍රාහී බව" නම් වූ සාධකය වැදගත් සේ නොසලකමින් සකස් කරන ලද ලකුණු ක්‍රමය.

B යෝජනා ක්‍රමය - එක් එක් දිස්ත්‍රික්කයන්හි ජනගහණය "ආහාර අනාරක්ෂිතභාවයට ඇති ග්‍රාහී බව" යන සාධකය අනෙකුත් සියලු සාධකවලට සාපේක්ෂව 10%ක් වැදගත් සේ සලකා සකස් කරන ලද ලකුණු ක්‍රමය.

වාරි ජල කළමනාකරණ සහ ගොවිජන සම්බන්ධතා අංශය

සම්පූර්ණ කරන ලද අධ්‍යයන

1. මහවැලි එච් කලාපයේ ජල පංගු ක්‍රමය පිළිබඳ අධ්‍යයනය.

පර්යේෂණ කණ්ඩායම

එම්.එම්.එම්. අනියර් මහතා	-	සහාය අධි පර්යේෂක
පී.සී.ජේ. ද සිල්වා මහතා	-	පර්යේෂණ නිලධාරී
ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා	-	පර්යේෂණ නිලධාරී

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ, ශ්‍රී ලංකාවේ ජල පංගු ක්‍රමයේ යෝග්‍යතාව, සඵලතාවය සඳහා කාර්යක්ෂමතාව පිළිබඳ සොයා බැලීමයි.

අධ්‍යයනය අනුව පෙනියන්නේ "ජල පංගු ක්‍රමය" නිසා භූමිය සහ ජලයේ ඵලදායිතාවය මෙන්ම භෝග තිව්‍රතාවය වර්ධනය වී ඇති බවයි. පූර්ව වශයෙන් නියම කරගත්, ජල ප්‍රමාණයන් ලබා දීම සම්බන්ධයෙන් ඇති සහතික බව නිසා ජල සම්පාදනය කෙරෙහි ගොඩනැඟුන විශ්වාසනියත්වය සහ ස්ථිරබව මත අතිරේක භෝග වගාව කෙරෙහි මුදල් යෙදවීමට ගොවීන් දිරිමත්ව ඇත. යටිතල පහසුකම් ක්‍රියා කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සම්පත් (මුදල් හා ද්‍රව්‍ය) ගොවින් විසින් ඒකරාශි කොට ඇති වුවද තිරසාර ලෙස දිගුකාලීනව මෙම ක්‍රමය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් ලැබෙන්නේ, ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා ස්වල්පයක් අඩුවෙනි.

2. වර්තමාන පොහොර බෙදාහැරීමේ වැඩපිළිවෙළ සමාලෝචනය කිරීම හා ගොවි හිතකාමී පොහොර ප්‍රතිපත්තියක් සැකසීමේ වැඩමුළුව. (2006 ජූලි 27)

සම්බන්ධීකාරකයන්

එම්.ඒ.සී. සිදත් බණ්ඩාර මහතා	-	පර්යේෂණ නිලධාරී
ජී.පී.දඑල්.ඩබ්. සමරසිංහ මහත්මිය	-	පර්යේෂණ නිලධාරිණී
ආර්.පී. විදානපතිරණ මහත්මිය	-	පර්යේෂණ නිලධාරිණී
ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මහත්මිය	-	පර්යේෂණ නිලධාරිණී

සුවිශේෂී වූ අරමුණු

* 2005/2006 මහ සහ 2007 යල කන්න තුළ ක්‍රියාත්මක වූ වර්තමාන පොහොර සහනාධාර වැඩපිළිවෙළ සමාලෝචනය කිරීම.
* මෙම පොහොර සහනාධාර වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී, එය ක්‍රියාත්මක කරන ආයතන හා ගොවීන් විසින් මුහුණ දුන් ගැටලු සහ දුෂ්කරතාවයන් හඳුනාගැනීම.
* පොහොර ආනයනයේදී හා බෙදාහැරීමේදී පැන නගින විවිධ ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම.
* ගොවි හිතකාමී පොහොර ප්‍රතිපත්තියක් සැකසීම.

නිර්දේශ

1. පොහොර සහනාධාරය සියලුම පොහොර වර්ග සඳහා සහ සියලුම භෝග වර්ග සඳහා ලබාදිය යුතුය. දිවයිනේ ඕනෑම ප්‍රදේශයකදී ඕනෑම අවස්ථාවක සාධාරණ මිලකට පොහොර මිලදී ගත හැකි විය යුතුය. මෙමඟින් පොහොර සම්බන්ධයෙන් පවතින අයථා භාවිතයන් සහ අක්‍රමිකතා අවම කර ගත හැකිය.

   වර්තමාන පොහොර සහනාධාර වැඩපිළිවෙල යටතේ සහනාධාරය හිමිවනුයේ කුඹුරු ඉඩම් යටතේ ලියාපදිංචි ගොවීන්ට පමණි. එබැවින් සහනාධාර මිලටම දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම එකම මිලකට පොහොර මිලදී ගැනීමේ හැකියාව ලැබුණහොත් කුඹුරු ඉඩම් යටතේ නොමැති ගොවීන්ටද, එම ප්‍රතිලාභය අත්කර ගත හැකි වනු ඇත. මෙම වැඩපිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට පුද්ගලික අංශයේ සහභාගිත්වයද ප්‍රයෝජනවත් වනු ඇත.

2. ඒකාබද්ධ පැළෑටි පෝෂක කළමනාකරණය අවධානය යොමු කළයුතු වැදගත් අංශයකි. මේ සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතා කිරීම සඳහා ගොවීන් උනන්දු කළ යුතුය. මෙමඟින් පරිසර දූෂණය අවම කර ගනිමින්, ගොවීන්ගේ ආදායම වැඩිකර ගැනීමටත්, පාංශු ව්‍යුහය දියුණු කර ගැනීමටත් ඉවහල් වනු ඇත.

3. රු.350/- ක මිලකට කුඹුරු ඉඩම් සඳහා පොහොර ලබා දීමට රජය වැය කරන මුදලට සමාන මුදලක් යොදවා රු.750/- බැගින් සියලුම භෝග සඳහා පොහොර ලබාදීමට හැකියාව ඇත. පොහොර මිල රු.350/- සිට රු.750/- දක්වා ගෙනඒමෙන් අඩුවන සහනාධාරය වෙනුවෙන් සහන සැලසිය යුතුයැයි හඳුනාගත් ගොවීන්ට කෘෂි ආම්පන්න, කාබනික පොහොර, පාංශු පරීක්ෂාවන් සිදුකර ගැනීම වැනි කරුණු සඳහා භාවිතා කළ හැකි කූපන්පත් නිකුත් කිරීම සිදු කළ යුතුය.

4. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත පොහොර ප්‍රමාණය භාවිතා කිරීමට හා ක්ෂුද්‍ර පෝෂක පොහොර භාවිතයට ගොවීන් දිරිමත් කළ යුතුය.

5. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අමතරව සමුපකාර හා රජයේ ලියාපදිංචි සැපයුම් කරුවන් මඟින් පොහොර නිකුත් කිරීම සිදුකළ යුතුය.

6. ක්ෂුද්‍ර පෝෂක පොහොර භාවිතය දිරිමත් කිරීම සඳහා, ඒවාට පනවා ඇති වැට් බදු ඉවත් කිරීම සිදුකල යුතුය. උදා, තේ වගාව සඳහා වැදගත් වන සින්ක් (Zn) ක්ෂුද්‍ර පෝෂක.

7. පොහොර සහනාධාර වැඩපිළිවෙළ සමඟ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහ කෘෂි භෝග රක්ෂණ වැඩසටහන හඳුන්වාදිය හැකිය.

8. දේශීය වශයෙන් පොස්පරස් පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය.

ක්‍රියාත්මක වෙමින් පවතින අධ්‍යයන

01. ශ්‍රී ලංකාවේ ජල සම්පත හා ප්‍රශස්ත ජල භාවිතය පිළිබඳ අත්පොත සම්පාදනය කිරීම.

පර්යේෂණ කණ්ඩායම

ආචාර්ය ඩබ්.එම්.පී.බී. ගිරාගම මහතා	-	අංශ ප්‍රධාන/සම්බන්ධීකාරක
ඒ. සමරකෝන් මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂක
එච්.එම්.ජේ.කේ. හේරත් මහතා	-	පර්යේෂණ නිලධාරී
එම්.ඒ.සී. සිදත් බණ්ඩාර මහතා	-	පර්යේෂණ නිලධාරී
පී.පී.ද. එල්.ඩබ්. සමරසිංහ මහත්මිය	-	පර්යේෂණ නිලධාරිනී
පී. විතාරණ මහතා	-	(ඉංජිනේරු, ගොවිජනසේවා දෙපාර්තමේන්තුව)

අරමුණ

ශ්‍රී ලංකවේ ජල සම්පත සහ වර්තමාන ජල භාවිතය පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පත ප්‍රශස්ත ලෙස යොදා ගැනීමේ ක්‍රමවේදයන් හඳුනා ගැනීම මෙහි අරමුණු කොට ඇත.

මෙහිදී ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන්ට ජල සම්පතෙහි ඇති වැදගත්කම හා එහි ප්‍රශස්ත භාවිතය පිළිබඳව දැනුවත් කිරීම සහ කෘෂි ජල කළමනාකරණය පිළිබඳ මනා අවබෝධයක් ලබා දීමට අදහස් කෙරේ.

අපේක්ෂිත ප්‍රතිඵලයන්

සංවර්ධන ක්‍රියාවලියේ නියුතු ගොවි නායකයන් හා අනෙකුත් නිලධාරීන්ට මෙම පොත ප්‍රයෝජනවත් වේ. මොවුන්ට ජලය රැස් කිරීම හා භාවිතය පිළිබඳව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ අනෙකුත් ආයතනවල පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳව අවබෝධයක් ලබාගත හැක.

අපේක්ෂිත ප්‍රතිලාභ

ජල භාවිතය පිළිබඳ අත්පොතක් ලෙස ගොවීන් හා අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන්ට මෙය භාවිතා කළ හැක.

අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක ජීවන වියදම් විමර්ශන කමිටුවට වෙළඳපොළ තොරතුරු සපයාදීම පිණිස 1979 වසරේදී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (ARTI) තුළ අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය (MFPD) පිහිටුවන ලදී. එතැන් සිට මෙම අංශය මඟින් ප්‍රතිපත්ති සම්පාදකයින්, ව්‍යවසායකයන්, වෙළඳුන්, ගොවීන් සහ ශිෂ්‍යයන්ට අදාළ දත්ත සහ තොරතුරු සපයා දෙනු ලබයි.

ඉහත සඳහන් කරුණු වලට අමතරව, ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පිහිටුවා ඇති ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ආවේක්ෂණ කමිටුවට මෙම අංශය මඟින් රජයේ හමුදා, රෝහල් සහ බන්ධනාගාරවලට ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අවශ්‍ය මිල තොරතුරු ලබා දෙයි.

සම්පූර්ණ කරන ලද අධ්‍යයනයන්

1. ආහාර තොරතුරු හා වෙළඳපොළ දැනුවත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය

පර්යේෂණ කණ්ඩායම

සම්බන්ධීකාරක

සී.පී. හතුරුසිංහ මහත්මිය	-	අංශ ප්‍රධානී

සම සම්බන්ධීකාරක

ටී. රවිචන්ද්‍රන් මහතා	-	සහාය අධි පර්යේෂක
රෝෂිණී රඹුක්වැල්ල මහත්මිය	-	පර්යේෂණ නිලධාරිණී
ආර්.පී. විදානපතිරණ මහත්මිය	-	පර්යේෂණ නිලධාරිණී

සහාය

සංඛ්‍යාන සහකාරවරුන්	-	14
අනියම් විමර්ශකයින්	-	18

අනුමත ඇස්තමේන්තුව	-	රු. 7,229,948.00
මහා භාණ්ඩාගාරයේ මූල්‍යමය දායකත්වය	-	රු. 3,780,000.00
වැය ඇස්තමේන්තුව	-	රු. 3,842,080.20

අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය විසින්, ප්‍රතිපත්ති තීරකයන්ට අවශ්‍ය නිවැරදි දත්ත හා තොරතුරු නිසි වේලාවට සැපයීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබයි. අදාළ ආහාර ද්‍රව්‍ය සඳහා වන අලෙවිකරණ තොරතුරු කොළඹ සහ ඒ අවට සිල්ලර වෙළඳපොළවල් නවයක් ආශ්‍රයෙන් එක්රැස් කරනු ලබන අතර පිටකොටුව, තොටලඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුලපන, නුගේගොඩ, කඩවත සහ කිරිබත්ගොඩ යන සිල්ලර වෙළඳපොළවල් සහ පිටකොටුව (කොළඹ) තොග වෙළඳපොල මෙයට අයත්ය. ඊට අමතරව, ප්‍රධාන නිෂ්පාදන දිස්ත්‍රික්ක සහ ප්‍රධාන ආහාර පරිභෝජනය කරන දිස්ත්‍රික්ක වශයෙන් හඳුනාගන්නා ලද දිස්ත්‍රික්කවල වෙළඳපොළවල් 23 ආශ්‍රයෙන්ද දත්ත හා තොරතුරු එක් රැස් කරනු ලබයි.

දත්ත රැස්කිරීම, සංඛ්‍යාන නිලධාරීන් 06 දෙනෙකුගෙන් සහ සංඛ්‍යාන සහකාරවරුන් 07 දෙනෙකුගෙන්ද, අනියම් විමර්ශකයන් 20 දෙනෙකු මඟින්ද සිදු කෙරේ. ඈත පළාත්වල දත්ත එක් රැස් කිරීම සඳහා සංඛ්‍යාන සහකාරවරුන් 15 දෙනෙකු භාවිතා කෙරේ.

2006 වර්ෂයේදී කුරුණෑගල, නිකවැරටිය, දඹුල්ල, මාතලේ, අනුරාධපුර, තඹුත්තේගම, පොළොන්නරුව, නුවරඑළිය, මහනුවර, හඟුරන්කෙත, බදුල්ල, කැප්පෙටිපොල, රත්නපුර, ඇඹිලිපිටිය, හම්බන්තොට, තිස්සමහාරාමය, මාතර, ගාල්ල, කළුතර, මොණරාගල, දෙහිඅත්තකණ්ඩිය, අම්පාර, පුත්තලම සහ මරඳගහමුල යන ප්‍රදේශ ආවරණය කරමින් දත්ත හා තොරතුරු ලබාගන්නා ලදී.

මීට අමතරව, ආහාර ද්‍රව්‍යවල තොග මිල ගණන් දිනපතා පිටකොටුව, මහනුවර, දඹුල්ල, නොරොච්චෝල, මරඳගහමුල සහ මීගොඩ යන වෙළඳපළවලින් එක් රැස් කරන ලදී. මෙම දත්ත දිනපතා විද්‍යුත් මාධ්‍ය හරහා

ප්‍රකාශයට පත් කෙරෙන අතර මේ තුළින් නිෂ්පාදකයන්ට හා වෙළඳුන්ට ප්‍රධාන තොග වෙළඳපළවල භාණ්ඩවල මිල ගණන් පිළිබඳව කල්-වේලා ඇතිව අවබෝධයක් ලබාගත හැකිය. කොළඹ සහ පිට පළාත්වල ආහාර ද්‍රව්‍ය සඳහා පවතින තොග සහ සිල්ලර මිලගණන් සහ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල නිෂ්පාදන මිල ගණන් විශ්ලේෂණය කොට, සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව සතියේ සෑම සිකුරාදා දිනකම නිකුත් කරනු ලබයි. 2006 වර්ෂයේදී සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකා ඉංග්‍රීසි පිටපත් 52 ක් හා සිංහල පිටපත් 52 ක් නිකුත් කොට ඇත.

2006 වර්ෂයේ ප්‍රගතිය

* සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව - විවරණිකා 52 ක් නිකුත් කොට ඇත.
* අදාළ ආයතන සහ නිලධාරීන් වෙත දිනපතා ආහාර ද්‍රව්‍ය මිල ගණන් සැපයීම - වර්ෂය පුරාම
* දිනපතා සහ සතිපතා තොරතුරු මාධ්‍ය වෙත වාර්තා කිරීම.
* ආහාර ද්‍රව්‍ය මිල ගණන් සහ අනිකුත් වෙළඳපළ තොරතුරු, රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන වෙත, ඔවුන්ගේ ඉල්ලීම්වලට අනුව සැපයීම.

2. මරදගහමුල පිහිටුවීමට යෝජිත ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම

සී.පී.හතුරුසිංහ මහත්මිය - අංශ ප්‍රධානී

සහාය කණ්ඩායම

ටී. රවිචන්ද්‍රන් මහතා - සහාය අධිපර්යේෂක
ටී.පී. සෝමරත්න මහතා - පර්යේෂණ නිලධාරී

අරමුණු

මරදගහමුල ප්‍රදේශයේ ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට ඇති ශක්‍යතාව පිළිබඳ පරීක්ෂා කිරීම.

ඇස්තමේන්තුගත පිරිවැය රු.21,189.00

මූල්‍ය දායකත්වය

ග්‍රාමීය සහ ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය, වාර්තාව 2006 වසරේ ජූනි මැද භාගයේ දී ඉදිරිපත් කොට ඇත.

ප්‍රධාන සොයාගැනීම්

මෙම ප්‍රදේශයේ ජීවත්වන වෙළඳුන්ට සහ පාරිභෝගිකයන්ට සිය නිෂ්පාදන විකිණීමට සහ පාරිභෝගිකයන්ට තම මූලික අවශ්‍යතාවයන් මිලදී ගැනීමට ආර්ථික මධ්‍යස්ථානයක් මෙම ප්‍රදේශයේ නොමැති බව නිරීක්ෂණය විය. එබැවින් ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ශක්‍යතාවයක් තිබෙන බවට අධ්‍යයනයෙන් අනාවරණය විය.

නිර්දේශ

කෘෂි නිෂ්පාදනවලට වටිනාකමක් ලබාගැනීමට සහ කෘෂි ආශ්‍රිත කර්මාන්ත වැඩිදියුණු කිරීමටත් මරදගහමුල ප්‍රදේශයේ ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට යෝග්‍ය වේ.

3. වී මෝල් පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම

සී.පී.හතුරුසිංහ මහත්මිය - අංශ ප්‍රධානී / සම්බන්ධීකාරක

සහාය කණ්ඩායම

ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා - සංඛ්‍යාන නිලධාරී
උපුල් එදුස්සූරිය මහතා - සංඛ්‍යාන සහකාර
නිරෝෂා මල්කාන්ති මහත්මිය - සංඛ්‍යාන සහකාර

මූල්‍ය දායකත්වය මහා භාණ්ඩාගාරය

අරමුණු

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම මත සකස් කරන ලද මෙම වාර්තාව අමාත්‍යාංශ ලේකම්වරයාට සහ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කමිටුවට ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී වගා කරන දිස්ත්‍රික්ක සහ අනෙකුත් දිස්ත්‍රික්කවල විසිරී සිටින සහල් මෝල් හිමියන් පිළිබඳ තොරතුරු එකතුවක් ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙන්ම පර්යේෂකයන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් බැවින් එම අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙම වාර්තාව සකස් කරන ලදී.

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ දිවයින පුරා විසිරී සිටින සහල් මෝල් හිමියන් පිළිබඳ තොරතුරු එක් රැස්කොට දිස්ත්‍රික්ක අනුව නිපදවන සහල් වර්ගය, කෙටීමේ ධාරිතාවය, යන්ත්‍රෝපකරණ, සහ ගබඩා ධාරිතාවය අනුව එම තොරතුරු විශ්ලේෂණය කොට ඉදිරිපත් කිරීමය.

අධ්‍යයනය සඳහා තැපැල් මාර්ගික ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලද අතර, ප්‍රශ්නාවලිය තැපැල් කරන ලද සහල් මෝල් හිමියන් 6000 ක් අතුරින් තොරතුරු එවන ලද සහල් මෝල් හිමියන් 1727 ගේ තොරතුරු විශ්ලේෂණයට භාජනය විය.

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකාවේ සහල් මෝල් කර්මාන්තය පිළිබඳව ගොනුවක් සකසන ලෙස ඉල්ලා සිටින ලදී. කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ පර්යේෂණ හා පුහුණු කමිටුවට එකී වාර්තාව ඉදිරිපත් කරන ලදී.

ධාරිතාවය අනුව සහල් මෝල් දිස්ත්‍රික්ක මට්ටමින් විසිරී ඇති ආකාරය

දිස්ත්‍රික්කය	ධාරිතාවය : දිනකට කොටනු ලබන වී ප්‍රමාණය (කි.ග්‍රෑම්)													
	>8000		5000 - 7999		2500 - 4999		1000 - 2499		<1000		ක්‍රියාත්මක නොවන		එකතුව	
	ගණන	%	ගණන	%	ගණන	%	ගණන	%	ගණන	%	ගණන	%	ගණන	%
අම්පාර	55	29.4	11	9.2	8	4.4	4	1.4	9	1.2	3	1.5	90	5.2
පොළොන්නරුව	27	14.4	19	15.8	40	21.9	30	10.9	28	3.7	13	6.4	157	9.1
අනුරාධපුර	20	10.7	26	21.7	27	14.8	18	6.5	16	2.1	6	3.0	113	6.5
හම්බන්තොට	28	15.0	11	9.2	3	1.6	2	0.7	2	0.3	2	1.0	48	2.8
කුරුණෑගල	4	2.1	6	5.0	15	8.2	10	3.6	2	0.3	-	-	37	2.1
කොළඹ	-	-	-	-	-	-	2	0.7	8	1.1	2	1.0	12	0.7
කළුතර	1	0.5	1	0.8	2	1.1	10	3.6	22	2.9	9	4.4	45	2.6
ගම්පහ	3	1.6	2	1.7	23	12.6	50	18.1	46	6.1	16	7.9	140	8.1
මහනුවර	2	1.1	7	5.8	7	3.8	28	10.1	178	23.5	55	27.1	277	16.0
මාතර	18	9.6	3	2.5	9	4.9	13	4.7	80	10.6	18	8.9	141	8.2
බදුල්ල	7	3.7	2	1.7	7	3.8	20	7.2	51	6.7	9	4.4	96	5.6
රත්නපුර	8	4.3	15	12.5	5	2.7	12	4.3	100	13.2	23	11.3	163	9.4
මොණරාගල	3	1.6	6	5.0	13	7.1	24	8.7	57	7.5	4	2.0	107	6.2
පුත්තලම	2	1.1	5	4.2	14	7.7	22	8.0	20	2.6	12	5.9	75	4.3
මාතලේ	2	1.1	2	1.7	1	0.5	8	2.9	25	3.3	9	4.4	47	2.7
කෑගල්ල	-	-	1	0.8	1	0.5	5	1.8	37	4.9	12	5.9	56	3.2
ගාල්ල	2	1.1	3	2.5	7	3.8	14	5.1	36	4.7	6	3.0	68	3.9
නුවරඑළිය	1	0.5	-	-	1	0.5	3	1.1	50	6.6	4	2.0	59	3.4
මඩකලපුව	4	2.1	-	-	-	-	-	-	-	-	-	-	4	0.2
මුලතිව්	-	-	-	-	-	-	1	0.4	1	0.1	-	-	2	0.1
එකතුව	187	100	120	100	183	100	276	100	758	100	203	100	1727	100

මූලය : සමීක්ෂණ තොරතුරු / අලෙවි, ආහාර හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය

4. රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන පිළිබඳ ඇගයීම - 2005/2006 මහ කන්නය

පර්යේෂණ කණ්ඩායම

සී.පී.හතුරුසිංහ මහත්මිය - සම්බන්ධීකාරක

ටී.ජී. සෝමරත්න මහතා - සම පර්යේෂක

අරමුණු

රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනෙහි සාර්ථකත්වය පිළිබඳ ඇගයීම සහ ඒ සම්බන්ධ ගැටලු සහ සීමාවන් හඳුනාගැනීම.

ඇස්තමේන්තු පිරිවැය රු.300,000.00

සීමාවන්

වී මිලදී ගැනීම පිළිබඳ දත්ත අදාළ අමාත්‍යාංශය මඟින් ලබා ගන්නා ලද අතර අදාල තොරතුරු ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලය හරහා ලබා ගැනීම.

ප්‍රධාන සොයා ගැනීම් -

* අවුරුද්දේ පළමු අර්ධයේ දී මිල ගණන් ක්‍රමයෙන් පහළ බැසීමක් දිස්වේ. මිල ස්ථාවර කිරීමේ අරමුණ ළඟාකර ගැනීමට අපොහොසත් වී ඇත.
* විවෘත වෙළඳපොළ මිල ගණන් නිෂ්පාදන පිරිවැය සුළු වශයෙන් ඉක්මවා ගිය මට්ටමක පැවතිනි.
* ලබාගත හැකි වූ දත්ත අනුව, මිලට ගත් වී ප්‍රමාණය මෙ.ටො. 142,097 ක් විය. සෑම ගොවි මහතෙකුටම වී කිලෝ 2000 අලෙවි කිරීමට හැකි වූයේ නම් මෙම වැඩසටහන යටතේ ගොවීන් 71,000 කට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවේ. මෙම ප්‍රමාණය වී වගාකරණු ලබන මුළු වී ගොවීන් සංඛ්‍යාවෙන් සියයට 4 කි.
* ලබාගත හැකි වූ දත්ත මූලාශ්‍ර දෙක අනුව, මිලට ගන්නා ලද වී තොග ප්‍රමාණයේ වෙනස්කමක් දක්වයි. දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කරනු ලැබුවේ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් එවන ලද දත්ත වේ. ඒ සඳහා හේතු වූයේ ප්‍රතිපාදන කලමනාකරණය දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කළ බැවිනි.
* ශ්‍රී ලංකාවේ නිෂ්පාදන පිරිවැයෙහි සාමාන්‍යයට වඩා අඩු නිෂ්පාදන පිරිවැයක් අතිරික්ත නිෂ්පාදනයක් ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක සඳහා පෙන්නුම් කරන බැවින් රජය මඟින් මිලදී ගැනීම සඳහා තීරණය කළ මිල ප්‍රායෝගික නොවේ. එම නිසා විවෘත වෙළඳපොළ බලවේග රජයේ මිලදී ගැනීමේ වැඩසටහන සම්පූර්ණයෙන්ම නොසලකා හරින ලදී. එම නිසා මෙම වැඩසටහන මඟින් ඉලක්ක කළ අරමුණු සපුරා ගැනීමට නොහැකි විය.

යෝජනා

* බොහොමයක් ගොවීන් වී ගොවිතැනෙහි නියැළී සිටින්නේ සුළු පරිමාන වශයෙනි. ඔවුන් සංවිධානය වී නොමැති අතර අලෙවි ගැටලු විෂයෙහි තනි තනිව මුහුණ දෙති. එම නිසා ගොවිපොළ ආදායම ඉහළ නැංවීම සඳහා රජයේ මැදිහත් වීම අත්‍යාවශ්‍ය වේ.
* ග්‍රාමීය ප්‍රදේශවල සමුපකාර සමිති සතුව වඩාත් සුදුසු අලෙවිකරණ ජාලයක් ඇති බැවින් ඔවුන්ට වී මිලදී ගැනීමේ කටයුතු පහසුවෙන් සිදු කළ හැකිය. තවද ඔවුන් සහල් සහ අනෙකුත් ආහාර ද්‍රව්‍ය අලෙවි කටයුතුවල නිරත වී සිටින අතර එම සමුපකාර සමිතිවල සමාජිකයින් ග්‍රාමීය ප්‍රදේශවල ගොවීන් වේ.
* වී/සහල් අලෙවිකරණය සඳහා රාජ්‍ය මැදිහත් වීම මඟින් ප්‍රධාන අරමුණු ළඟාකර ගැනීම පිළිබඳ පසුගිය අත්දැකීම් අනුව, ස්ථාවර ප්‍රතිපත්ති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මුදල් ප්‍රතිපාදන පහසුකම් සැපයීම යටිතල පහසුකම් සහ අධීක්ෂණය සඳහා මනා ක්‍රමවේදයක් සැකසීම සිදු කළ යුතු වේ.
* වී මිලට ගැනීම අධීක්ෂණය කිරීම සඳහා ප්‍රායෝගික වූ මනා ක්‍රමවේදයක් සැකසිය යුතුය. එය වෙළඳපොල තරඟකාරීත්වය ඉහළ දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු වේ.
* වී මිලට ගැනීමේ දී ප්‍රමිතියෙන් ඉහළ වී සාධාරණ මිලකට මිල දී ගැනීම සඳහා උපදෙස් ලබා දිය යුතු අතර වී තොග හිඟ කාලයේදී සුළු පරිමාන මෝල් හිමියන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි අලෙවි කළ යුතු වේ.
* බොහොමයක් දිස්ත්‍රික්කවල වාර්ෂිකව දිස්ත්‍රික්කය තුල සහල් හිඟයක් පවතින අතර නාගරික ප්‍රදේශවල වර්ෂය පුරාම සහල් හිඟය ක් පවතී. එම නිසා සහල් අලෙවිකරණ පිරිවැය අවම කිරීමේ අරමුණින් සුදුසු ප්‍රාදේශීය අලෙවිකරණ සැලසුමක් සැකසිය යුතු වේ.

5. කුරුඳුවත්ත ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම
සම්බන්ධීකරණය

ටී.ඒ. ධර්මරත්න මහතා - සහාය අධි පර්යේෂක

සහාය පර්යේෂක

ටී.ජී. සෝමරත්න මහතා - පර්යේෂණ නිලධාරී
ඩබ්ලිව්.ඒ.එන්. විජේසූරිය මහතා - සංඛ්‍යාන නිලධාරී

ඇස්තමේන්තු පිරිවැය 235,865.00
මූල්‍ය දායකත්වය ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය

මෙම පර්යේෂණ අධ්‍යයන වාර්තාව 2006 දෙසැම්බර් මාසයේදී, ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී.

අරමුණු

ගම්පොළ මැතිවරණ කොට්ඨාශයේ පිහිටි කුරුඳුවත්ත උප නාගරික ප්‍රදේශය තුල නව ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටු විම පිළිබඳව පවතින ශක්‍යතාවය අධ්‍යයනය කිරීමය.

සොයාගැනීම්/නිර්දේශ

ඒ අනුව, ප්‍රදේශය තුල, ප්‍රධාන අපනයන බෝග ලෙස ගම්මිරිස්, කරඳමුංගු සහ කෝපි සඳහාත් දේශීය එළවළු සහ පලතුරු වර්ග කිපයක් සඳහාත්, නව ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටු වීමේ ශක්‍යතාවයක් පවතින බව මෙම පර්යේෂණ අධ්‍යයනයෙන් අනාවරණය විය.

6. බලංගොඩ ප්‍රදේශයේ ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීම පිළිබඳ මූලික නිරීක්ෂණ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම
සම්බන්ධීකරණය

ටී.ඒ. ධර්මරත්න මහතා - සහාය අධි පර්යේෂක

සහය පර්යේෂක

සී.පී. හතුරුසිංහ මහත්මිය - අංශ ප්‍රධානී
ටී.ජී. සෝමරත්න මහතා - පර්යේෂණ නිලධාරී

ඇස්තමේන්තු පිරිවැය 37,250.00
මූල්‍ය දායකත්වය ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය

මෙම අධ්‍යයන වාර්තාව 2006 දෙසැම්බර් මාසයේදී, ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී.

අරමුණ

බලංගොඩ ප්‍රදේශය තුල නව ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටු වීමේ මූලික හැකියාවක් පවති ද යන්න පිළිබඳ නිරීක්ෂණයන් ඉදිරිපත් කිරීමය.

සොයා ගැනීම් / නිර්දේශ

එහි ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ මනා වාසිදායක තත්ත්වයක් පවතින බවට කරුණු අනාවරණය වූ අතර, වර්ෂය පුරා සිදුකරන එළවළු නිෂ්පාදනයන් පවතින බව නිරීක්ෂණය විය. එසේම ප්‍රදේශයේ දැනට පවතින කෘෂිකාර්මික අලෙවිකරණ ගැටළු සඳහා ද, මෙවැනි මධ්‍යස්ථානයක අවශ්‍යතාවය නිරීක්ෂණයට ලක් විය.

7. ශ්‍රී ලංකාවේ වගා රක්ෂණ ක්‍රමය පිළිබඳ ඇගයීම

පර්යේෂණ කණ්ඩායම
සම්බන්ධීකරණය

රෝෂිනී රඹුක්වැල්ල මහත්මිය - පර්යේෂණ නිලධාරිණී

සහාය පර්යේෂක

ටී.පී. සෝමරත්න මහතා - පර්යේෂණ නිලධාරී
රුවිනි විදානපතිරණ මහත්මිය - පර්යේෂණ නිලධාරිණී

ඇස්තමේන්තු පිරිවැය රු. 481,240.00
මූල්‍ය දායකත්වය කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව (CARP)

අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන වගා රක්ෂණය (විශේෂයෙන්ම වී වගා රක්ෂණය) පිළිබඳව ඇගයීමක් සිදු කිරීමයි.

මෙම අධ්‍යනයේදී ප්‍රධාන වශයෙන් වී වගාව පිළබඳව අවධානය යොමු කරන බැවින් වී වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක වන අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල සහ හම්බන්තොට ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. නියැදිය තෝරාගැනීමේදී බහු පියවර නියැදි ක්‍රමය යොදා ගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු 2006 ජනවාරි මස සිට 2006 අප්‍රේල් මාසය දක්වා සිදු කරන ලද අතර ද්විතියික දත්ත කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන්ද, සෙලින්කෝ රක්ෂණ සමාගමෙන් ද ලබාගන්නා ලදී.

නිගමන

1977/78 මහ කන්නය තුළ ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 40% කට ආසන්න ප්‍රමාණයක් රක්ෂණය කල අතර එය 2004/2005 මහ කන්නය වන විට මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 1% ආසන්න ප්‍රමාණයක් දක්වා ශීඝ්‍ර ලෙස පහළ ගොස් තිබුණි. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හා සැසඳීමේදී සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් රක්ෂිත වී වගා බිම් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වීමක් පෙන්නුම් කළ ද රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය විසින්ම රක්ෂිත මුළු වී වගා බිම් ප්‍රමාණය මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 2%ක් තරම් සුළු ප්‍රමාණයක් වෙයි.

වගා රක්ෂිත ක්‍රමය සම්බන්ධයෙන් ගොවීන්ගේ විශ්වාසනීය බව ගිලිහී ඇති අතර ස්වේච්ඡා සහභාගිත්වය ඉතාමත් අඩු මට්ටමක පවතී. වන්දි ප්‍රමාණවත් නොවීම සහ වන්දි ලැබීමේදී සිදුවන අනවශ්‍ය ප්‍රමාදයන් ගොවීන් වගා රක්ෂණ ක්‍රමයෙන් දුරස් වීම සඳහා බලපාන ලද කරුණු වේ. හානි තක්සේරු කිරීමේදී සහ වන්දි ගෙවීමේදී විනිවිදභාවයක් නොමැතිවීම සහ හානි අඩු වශයෙන් තක්සේරු කිරීම ද ගොවීන් වගා රක්ෂණ ක්‍රමය කෙරෙහි කළකිරීමට හේතු වේ.

දැනට වගා රක්ෂණ ක්‍රමය සඳහා දායක වී ඇති ගොවීන්ගෙන් 99%ක් ම පාහේ වගා රක්ෂණයට යොමු වී ඇත්තේ වගා ණය ලබාගැනීමේ පූර්ව කොන්දේසියක් සම්පූර්ණ කිරීමක් වශයෙනි. වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුවත්භාවය ඉතාමත් අල්ප වන අතර වගා රක්ෂණයේ පවතින ප්‍රතිලාභ සම්බන්ධයෙන් හෝ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන්ද ඔවුන්ට නිසියාකාර අවබෝධයක් නැත. ගොවීන් සහ රක්ෂණ නිලධාරීන් අතර ප්‍රමාණවත් පරිදි සංනිවේදනයක් සිදු නොවීමක්, වගා රක්ෂණය ගොවීන් අතර ජනප්‍රිය නොවීමට එක් හේතුවකි. වත්මන් තත්ත්වය අනුව සමහර බැංකු විසින් වගා ණය ලබාදීමේදී රක්ෂණය අනිවාර්ය කරුණක් සේ නොසලකන බැවින් වගා රක්ෂණය සඳහා දායක වන ගොවීන්ගේ සංඛ්‍යාව ඉදිරියේදී තවදුරටත් අඩු වීමේ ප්‍රවණතාවක් පවතී.

රක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී සිදුවන දූෂණයන්, එහි වර්ධනයට බලපා තිබේ. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් වගා රක්ෂණ ක්‍රමයේ අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොමැති බව පෙනේ.

වගා හානියකදී ප්‍රමාණවත් පරිදි වන්දි ලබාදීම මඟින් ගොවීන්ගේ ආදායම් ස්ථායිතාවය ඇති කිරීමට මෙම ක්‍රමය අපොහොසත් වී ඇත. කෘෂි රක්ෂණ මණ්ඩලය සතුව ප්‍රමාණවත් මූල්‍යමය ස්ථාවරත්වයක් නොමැති බැවින් වැඩි අවදානම් ප්‍රදේශයන් ආවරණයක් සිදු නොකරයි. ඉන් ගම්‍ය වන්නේ ප්‍රධාන අරමුණ සපුරා නොමැති බවයි.

වන්දි ලබා දීමේදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට සාපේක්ෂව පෞද්ගලික අංශය කාර්යක්ෂම බවක් පෙන්නුම් කරනු ලබයි. පෞද්ගලික රක්ෂණ සැලසුම් සඳහා මාසයක හෝ දෙකක කාලය තුලදී 60% කින් පමණ ප්‍රතිචාර ලැබී ඇත. කෙසේ වෙතත් සඳහන් අරමුණු මුදුන්පත් වී නැති අතර ගොවීන්ගේ ආදායම හෝ වගා විනාශ වීම සඳහා වන්දි ගෙවීම ප්‍රමාණවත් නොවේ.

ක්‍රියාත්මක අධ්‍යයන

1. වාරියපොල පිහිටුවීමට යෝජිත ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය.

පර්යේෂණ කණ්ඩායම

සි.පි.හතුරුසිංහ මහත්මිය - අංශ ප්‍රධානි

සම පර්යේෂකයන්

ටී. රවිචන්ද්‍රන් මහතා - සහාය අධි පර්යේෂක

ටී.ජී. සෝමරත්න මහතා - පර්යේෂණ නිලධාරී

සහාය

ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා - සංඛ්‍යාන නිලධාරී

උපුල් අරුණ ශාන්ත මහතා - සංඛ්‍යාන සහකාර

අරමුණ

වාරියපොල නගරයේ ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීමට ඇති ශක්‍යතාව පිළිබඳ පරීක්ෂා කිරීම.

ඇස්තමේන්තු කළ පිරිවැය - රු.32,637.50

ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයයෙන් මුදල් ප්‍රතිපාදන ලබාදුන් අතර 2007 පෙබරවාරි මාසයේදී අවසාන වාර්තාව ලබා දෙන ලදී.

නිර්දේශ

වර්තමානයේදී සෑම ඉරිදා දිනකම තොග හා සිල්ලර වශයෙන් වාරියපොළ පොළ ක්‍රියාත්මක වේ. මෙම ඉරිදා පොළ ආරම්භයක් වශයෙන් සතියේ වෙනත් දින දෙකක ද ක්‍රියාත්මක කොට, වෙළඳුන් සහ ගොවීන් සඳහා අලෙවි කටයුතු පුළුල් කළ හැකිවේ. පසුගිය වසර කිහිපයක දත්ත අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආහාර භෝග නිෂ්පාදනයේ අඩුවීමක් වාර්තා වේ.

වර්තමානයේදී නිෂ්පාදන අලෙවි කරන්නේ ග්‍රාමීය පොළ සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුලය. මෙම ග්‍රාමීය පොළ, "පොළ රවුම" අනුව ක්‍රියාත්මක වේ. පාරිභෝගික අවශ්‍යතා සැපිරීම සඳහා මෙම පොළ සඳහා වැඩිපුර තොග සැපයෙන්නේ දඹුල්ල සහ නොරොච්චෝලේ ආර්ථික මධ්‍යස්ථාන වලිනි.

2. ආහාර අනාරක්ෂිතභාවය හා එයට නැඹුරුවීමට ඇති අවදානම පිළිබඳ තොරතුරු එකතු කිරීම හා සිතියම්ගත කිරීම (*FIVIMS*)

පර්යේෂණ කණ්ඩායම

සම්බන්ධීකරණය ආචාර්ය ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී

මූල්‍ය දායකත්වය ආහාර හා කෘෂිකර්ම සංවිධානය

පර්යේෂණ කාලසීමාව 2005 අගෝස්තු සිට මේ දක්වා

ඇස්තමේන්තු අයවැය මිලියන 2.2

කේන්ද්‍රීය ආයතනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

මෙම ව්‍යාපෘතිය ජාතික මට්ටමින් ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වන අතර මේ සඳහා හෙ.කො.ගො.ප.පු. ආයතනය කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකරයි. 1999 නොවැම්බර් 9-12 දින දක්වා පැවැත්වූ ආහාර හා පෝෂණය සඳහා වූ ආසියා ශාන්තිකර කලාපිය ඒකාබද්ධතාවයේ කාලාපිය විශේෂඥයින්ගේ වැඩමුළුවකදී මෙවැනි තොරතුරු පද්ධතියක් ස්ථාපනය කළ යුතු බවට එකඟ වූ අතර ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති මෙම ආයතනය තෝරාගන්නා ලදී.

ව්‍යාපෘතියේ අරමුණු

අ. ආහාර අනාරක්ෂිතභාවය හා එයට නැඹුරු වීමේ ඇති අවදානම පිළිබඳ ජාතික, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් තොරතුරු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

ආ. ආහාර ආනාරක්ෂිතභාවය හා එයට නැඹුරු වීමේ ඇති අවදානම අවම කිරීම සඳහා ගතහැකි ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ට හා සැලසුම්කරුවන්ට සහාය වීම.

ඇ. ආහාර අනාරක්ෂිතභාවය පිළිබඳ ඇගයීම හා ඒ ආශ්‍රිත තොරතුරු විද්‍යුත් හා ලිඛිත මාධ්‍යයෙන් බෙදා හැරීම.

ක්‍රියාකාරකම් :

අ. ආහාර අනාරක්ෂිත බව හා අවදානම පිළිබඳ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.

ආ. ආහාර අනාරක්ෂිතභාවය හා එයට නැඹුරු වීම පිළිබඳ ඇගයීම සිදු කිරීම.

ඇ සාකච්ඡා, සම්මන්ත්‍රණ මඟින් ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම.

ඈ. FIVIMS තොරතුරු ජාලයක් අන්තර්ජාලය ආශ්‍රයෙන් ස්ථාපනය කිරීම.

ඉ. තොරතුරු පත්‍රිකා සැකසීම.

ඊ. ප්‍රතිපත්ති හා විශ්ලේෂණ වාර්තා සැකසීම.

සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය

සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා සම්බන්ධ තොරතුරු සැපයීමේ ජාතික මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කරයි. කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතියක් ඇතිකිරීම තුළින් ජාතික සංවර්ධනයට දායක වීමේ අභිප්‍රාය පෙරදැරි කොටගෙන, 1979 වර්ෂයේ දී ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයෙහි (USAID) සහාය ඇතිව ස්ථාපනය කරන ලද මෙම අංශයෙහි ප්‍රධාන කාර්ය භාරය වන්නේ කෘෂිකාර්මික හා ගොවි කටයුතු ආශ්‍රිත තොරතුරු රැස්කිරීම හා ඒවා ගොවීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත ලබාදීමයි. ඒ අනුව පර්යේෂකයන්, සැලසුම් කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, උපාධි අපේක්ෂකයන්, ගොවි මහතුන් සහ වෙනත් උනන්දුවන පුද්ගලයන් ඇතුළු විශාල පිරිසක් මෙමගින් ප්‍රයෝජනය ලබයි. දත්ත සංවර්ධන ඒකකය, පරිගණක ඒකකය හා පුස්තකාලය වශයෙන් මෙම අංශය ප්‍රධාන ඒකක 3 කින් සමන්විත වේ. දත්ත සංවර්ධන ඒකකය හා පරිගණක ඒකකය මඟින් සංඛ්‍යාත්මක තොරතුරු රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරනු ලබන අතර ග්‍රන්ථ නාමාවලි තොරතුරු සැපයීමේ මධ්‍යස්ථානය වශයෙන් පුස්තකාලය කටයුතු කරනු ලැබේ. ප්‍රකාශන ඒකකය ද මෙම අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාකාරී වේ.

දත්ත සංවර්ධන ඒකකය

කාර්ය මණ්ඩලය : දත්ත විශ්ලේෂක
සංඛ්‍යාන නිළධාරී
දත්ත සහායක
කාර්යාල ලේකම්/ලඝු යතුරු ලේඛක

දත්ත විශ්ලේෂකවරු දෙදෙනෙකු, සහ දත්ත සහකාරවරු තිදෙනෙකු 2006 වසර තුළ, මෙම ඒකකයෙහි සේවයෙහි නිරත වූහ. නව දත්ත ලබා ගැනීම විශ්ලේෂණය කිරීම හා දත්ත යාවත්කාලීන කිරීම මෙම ඒකකයෙහි ප්‍රධාන කාර්යය වේ.

දත්ත බැංකුව

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රවලින් රැස් කරගන්නා දත්ත ඇසුරින් කෘෂි භෝග, පශු සම්පත්, ජනගහනය, අලෙවිකරණය සහ වෙනත් වැදගත් සංඛ්‍යාත්මක තොරතුරු මත දත්ත පදනමක් (Database) පවත්වාගෙන යාම මෙම අංශයෙහි කාර්ය භාරය වේ. 2006 වර්ෂය තුළ දී පහත දැක්වෙන දත්ත මාලාවන් යාවත්කාලීන කර ඇත.

1. 2005 වර්ෂයේ, වී වගාව හා සම්බන්ධ වගා කළ භූමි ප්‍රමාණය, නිපද වූ ප්‍රමාණය, නිෂ්පාදන පිරිවැය හා ලැබූ ලාභය පිළිබඳ තොරතුරු.
2. 2005 වර්ෂයේ, රනිල භෝග, අල වර්ග, තෙල් නිපදවන බීජ, කාර්මික භෝග, කුළු බඩු සහ එළවළු යනාදියෙහි වගා කළ භූමි ප්‍රමාණය සහ නිපද වූ ප්‍රමාණය.
3. 2005 වර්ෂයේ, ලබාගත හැකි සියලුම භෝගයන්හි සාමාන්‍ය නිෂ්පාදන මිළ ගණන් හා සිල්ලර මිල ගණන්.
4. 2004/2005 මහ සහ 2005 යල කන්නවල, ලබාගත හැකි සියලුම භෝගයන්හි නිෂ්පාදන පිරිවැය.
5. 2005 වර්ෂයේ දිස්ත්‍රික් පදනම මත පශු සම්පත් ගහණය හා නිෂ්පාදනය.
6. 2005 වර්ෂයේ දිස්ත්‍රික් පදනම මත වාර්ෂික මධ්‍ය ජනගහනය.
7. 2005 වර්ෂයේ සියලුම කෘෂි භෝගයන් හි ආනයන හා අපනයන තොරතුරු.

විශ්ලේෂණය සඳහා පරිගණක ඒකකය වෙත පවරන ලද පර්යේෂණ අධ්‍යයනයන්ට අදාළ දත්ත, ඒකකයෙහි දත්ත ලේඛනයට ඇතුළත් කොට ඇත.

දත්ත සඳහා ඉල්ලීම්

2006 වර්ෂය තුළ, දත්ත බැංකුව වෙත ලැබුණු මුළු ඉල්ලීම් සංඛ්‍යාව 144 කි. එයින් ඉල්ලීම් 105 (73%) ක ප්‍රමාණයක් බාහිර ඉල්ලීම් වන අතර ඉතිරි වූ ඉල්ලීම් 39 (27%) ක ප්‍රමාණය අභ්‍යන්තර (ආයතනය තුළ) ඉල්ලීම් වේ. එම ඉල්ලීම් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

	සංඛ්‍යාව	ප්‍රතිශතය(%)
විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩල/උපාධි අපේක්ෂකයන්/වෙනත් සිසුන්	45	31.2
අමාත්‍යංශ/රාජ්‍ය දෙපාර්තමේන්තු/අර්ධ රාජ්‍ය සංවිධාන නිලධාරීන්	21	14.1
පුද්ගලික සමාගම්	19	13.2
රාජ්‍ය නොවන සංවිධාන	6	4.2
බැංකු	3	2.1
ජාත්‍යන්තර සංවිධාන/තානාපති කාර්යාල	2	1.4
පුද්ගලික ආයතන	1	0.7
මාධ්‍යවේදීන්	1	0.7
වෙනත් පුද්ගලයන්	7	4.9
අභ්‍යන්තර ඉල්ලීම්	39	27.1
එකතුව	144	100.0

දත්ත සැපයීමෙන් ලැබූ ආදායම

2006 වර්ෂය තුළ දී, බාහිර අයදුම්කරුවන් සඳහා දත්ත සැපයීම තුළින් ඉපැයූ මුළු ආදායම රු. 26,022.76 ක් වන අතර බාහිර හා අභ්‍යන්තර වශයෙන් නොමිලේ දත්ත සැපයීමේ ඇස්තමේන්තුගත පරිවැය රු: 7,967.60 කි.

පරිගණක ඒකකය

කාර්ය මණ්ඩලය : ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශ්ලේෂක
විශ්ලේෂක / වැඩ සටහන්
දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරු
අනියම් දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරු

සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශයෙහි පරිගණක ඒකකය, දත්ත සැකසීම හා විශ්ලේෂණය සඳහා අවශ්‍ය පහසුකම් සපයයි. ඒකකයෙහි ප්‍රධාන කාර්ය භාරය ආකාර 4 කි. එනම් ආයතනයට පැවරී ඇති අධ්‍යයනයන්හි දත්ත විශ්ලේෂණය, දත්ත බැංකුව සඳහා දත්ත සැකසීම හා විශ්ලේෂණය, පද්ධති සංවර්ධනය සහ පුහුණු කිරීම් වශයෙනි.

දත්ත විශ්ලේෂණය

සලකා බලන කාල පරිච්ඡේදය තුළ පහත සඳහන් අධ්‍යයනයන්ට අදාළ දත්ත විශ්ලේෂණ කටයුතු සම්පූර්ණ කර ඇත.

1. ගෘහස්ථ මට්ටමින් සහල් සැකසීමෙහි ආර්ථික වැදගත්කම පිළිබඳ අධ්‍යයනය.
2. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය ඇගයීම පිළිබඳ අධ්‍යයනය.
3. "ගම නැගුම වැඩසටහන" යටතේ ආදර්ශ ගම්මාන ලෙස දියුණු කිරීම සඳහා තෝරාගත් ගම් 10 ක පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ මූලික සමීක්ෂණය.
4. වර්ෂාපෝෂිත උස්බිම් වගාව ආශ්‍රිත කෘෂිකාර්මික හා ව්‍යාප්ති සේවා ගැටලු හඳුනාගැනීම පිළිබඳ අධ්‍යයනය.

කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශයෙහි ඉල්ලීම පරිදි, කෘෂිකාර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා තේරීම් දර්ශකයක් (selection criterion) පිළියෙල කිරීම සිදු කරන ලදි.

දත්ත බැංකුව හා අදාළ කාර්යයන්

දත්ත ඇතුළත් කිරීම, දත්තයන්හි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම හා පද්ධති සංවර්ධනය ලෙස කාණ්ඩ 3 කට අදාළ වන පරිදි දත්ත බැංකුව හා සම්බන්ධ කාර්යයන් ක්‍රියාවට නංවන ලදි. වසර තුළ ධාන්‍ය වර්ග, එළවළු වර්ග, නිෂ්පාදන පිරිවැය, ආදායම, තොග හා සිල්ලර මිළ ගණන් යන ප්‍රභේදයන්ට අයත් වූ දත්ත වාර්තා 107,144 ක ප්‍රමාණයක් දත්ත බැංකුවට ඇතුළත් කර ඇත. එලෙසම, ධාන්‍ය වර්ග, එළවළු, අල වර්ග සහ කාර්මික භෝගයන්ට අදාළ ඉකුත් දත්තයන්හි නිරවද්‍යතාවය තහවුරු කොට ඇති අතර ඉතා ප්‍රයෝජනවත් අන්දමින් දත්ත ලබාගැනීම සඳහා දත්ත බැංකු පද්ධතිය නවීකරණය කර ඇත.

පද්ධති සංවර්ධනය

පරිගණක ඒකකය මඟින්, ආයතනයෙහි වැටුප් ලැයිස්තුව අදාළ පරිගණකගත පද්ධතිය පවත්වාගෙන යනු ලබන අතර ආයතනයෙහි වෙබ් අඩවිය යාවත්කාලීන කොට පවත්වාගෙන යාමේ වගකීම ද දරනු ලැබේ.

පුස්තකාලය

කාර්ය මණ්ඩලය : පුස්තකාලයාධිපති
සහකාර පුස්තකාලයාධිපති
පුස්තකාල සහයක - 1 ශ්‍රේණිය
යතුරු ලේඛක/ කාර්යාල ලේකම්

පුස්තකාලය සතු මූලික කාර්යය වන්නේ, ආයතනයෙහි පර්යේෂණ කාර්ය මණ්ඩලයේ මෙන්ම වෙනත් උනන්දුවන පුද්ගලයන්ගේ සහ නියෝජිත ආයතනයන්හි ප්‍රයෝජනය පිණිස, කෘෂිකාර්මික අංශයට සම්බන්ධ තොරතුරු එක් රැස් කිරීම, ගොනු කිරීම, සමුද්ධරණය සහ බෙදා හැරීමයි. වර්ෂය තුළ කාර්ය මණ්ඩලය වෙත නිකුත් කර ඇති පොත් සංඛ්‍යාව 1,197ක් සහ සඟරා සංඛ්‍යාව 349 කි. එමෙන්ම පුස්තකාලය පරිහරණය සඳහා පැමිණි බාහිර පුද්ගලයන්ගේ සංඛ්‍යාව 387ක් වන අතර එයින් බහුතරය විශ්ව විද්‍යාල සිසුන් වේ.

පුස්තකාලය සඳහා පොත්, සඟරා, වාර්තා, සිතියම් හා සංගත තැටි ලබා ගැනීම

වසර තුළ, පුස්තකාලය විසින් ලබාගත් පොත් සහ වාර්තා සංඛ්‍යාව 320 කි. එයින් 230 ක ප්‍රමාණයක් සෘජු මිලදී ගැනීම් වූ අතර ඉතිරිය, හුවමාරු පදනම මත හෝ සහයෝගිතා පදනම මත ලබා ගන්නා ලදි. දේශීය විදේශීය ආයතන වලින් පුවත් වාරික, පුවත් හසුන් හා වාර්ෂික වාර්තා රාශියක් හුවමාරු පදනම මත හෝ සහයෝගිතා පදනම මත ලැබී ඇති අතර වසර තුළ විදේශීය සඟරා 21ක් සහ දේශීය සඟරා 28ක් වාර මුදල් ගෙවා ලබාගෙන ඇත. 2006 වර්ෂය අවසානයේදී පුස්තකාලය සතු මුළු පොත්පත් සංඛ්‍යාව 20,695 කි. එම වසර සඳහා පොත් මිල දී ගැනීම් සහ සඟරා සඳහා සාමාජික මුදල් වෙනුවෙන් වූ මුළු පිරිවැය රු: 748,622/-ක් වේ.

අන්තර් පුස්තකාල සහයෝගිතාවය

පුස්තකාලය, කෘෂිකාර්මික තොරතුරු ජාලයෙහි (AGRINET) සාමාජිකත්වය දරන අතර එහි කේන්ද්‍රස්ථානය වන්නේ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) පුස්තකාලයයි. එම තොරතුරු ජාලය සඳහා (AGRINET SDCP Scheme) පුස්තකාලය සිය දායකත්වය අඛණ්ඩව ලබා දී ඇත. මෙම වර්ෂය තුළ, සඟරා 14 කට අදාළ පටුන පිටු 304 ක ප්‍රමාණයක් සාමාජික පුස්තකාල වෙත යවා ඇති අතර සඟරා 5 කට අදාළ පටුන පිටු 21ක් ලැබී ඇත. ආපසු දීමේ පදනම මත වූ අන්තර් පුස්තකාල ඉල්ලීම් සංඛ්‍යාව 8කි. අන්තර් පුස්තකාල ණය පදනම යටතේ, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ නිලධාරීන් සඳහා ද පොත් ලබා ගැනීමේ පහසුකම් සපයා ඇත.

කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) පුස්තකාලය මඟින් පවත්වාගෙන යනු ලබන ජාතික කෘෂිකාර්මික ග්‍රන්ථ නාමාවලි දත්ත සමුදාය (8 වන වෙළුම 2005) සඳහා පොත් හා සඟරා ලිපිවලට අදාළ පරිගණකගත දත්ත වාර්තා 100ක් ද පුස්තකාලය විසින් අඛණ්ඩව සපයනු ලැබ තිබේ.

තවද, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පුස්තකාලය මඟින් කළ ඉල්ලීමකට අනුව එම ආයතනයෙහි, ශාක ජනනය සහ ජෛව තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව වෙත පහත සඳහන් ග්‍රන්ථ නාමාවලි සඳහා පොත් හා සඟරා ආශ්‍රිත පරිගණකගත දත්තයන් ද සපයා ඇත.

1. ශ්‍රී ලංකාවට අදාළ වූ ශාක ජනනය සහ ජෛව තාක්ෂණය පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය
2. දේශීය දැනුම (දේශීය හා විදේශීය සාහිත්‍ය) පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය

ප්‍රකාශන හුවමාරු වැඩසටහන

2006 වර්ෂය තුළ, ආයතනය විසින් නිකුත් කළ ප්‍රකාශන 5ක්, දේශීය පුස්තකාල 10ක් සහ විදේශීය ආයතනයන්හි පුස්තකාල 10ක් වෙත යවා ඇත.

පුස්තකාලයෙහි ග්‍රන්ථ නාමාවලි දත්ත සමුදායට අයත් විද්‍යුත් ලේඛනය, පොත් හා සඟරා ලිපි වලට අදාළ දත්ත වාර්තා 600 කින් ඉහල නංවා ඇත. තාවකාලිකව පොත් ලබා දීම, පරිශීලනයට ඉඩ සලසා දීම, අවශ්‍ය

ජායා පිටපත් ලබා දීම වැනි පහසුකම් වලට අමතරව පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර සේවාදායකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ද පුස්තකාලය විසින් නොකඩවා පවත්වාගෙන යන ලදි.

ප්‍රකාශන ඒකකය

ප්‍රකාශන ඒකකයෙහි කාර්ය භාරය වන්නේ, පර්යේෂණ වාර්තා, ප්‍රකාශන, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, පත්‍රිකා හා වෙනත් තොරතුරු සටහන් ප්‍රකාශන ආදිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීමයි. තවද, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් මෙහෙය වීම ද මෙමගින් ඉටුකරනු ලැබේ. අදාළ කාලය තුළ, ප්‍රකාශන ඒකකය පහත දක්වා ඇති ප්‍රදර්ශන සඳහා සහභාගි වී ඇත.

1. "පුලතිසි නවෝදය" ප්‍රදර්ශනය පොළොන්නරුව රාජකීය මධ්‍ය මහා විද්‍යාලය, 2006 මාර්තු මස 22-27 දක්වා
2. "විස්කම් දැක්ම - 2006" අධ්‍යාපනික හා කාර්මික ප්‍රදර්ශනය, හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය 2006 මාර්තු මස 08-12 දක්වා
3. "ගමින් ගමට ජනපති සත්කාරක" ප්‍රදර්ශනය දෙබරවැව රාජකීය විද්‍යාලය, තිස්සමහාරාමය, 2006 ඔක්තෝබර් මස 28-31 දක්වා

අදාළ වසර තුළ පහත සඳහන් ප්‍රකාශනයන් නිකුත් කරන ලදි.

1. ගැටුම් කලාපයට යාබද ගම්මානයන්හි සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි සටන් විරාම ගිවිසුමේ බලපෑම පිළිබඳ පර්යේෂණ වාර්තාව.
2. ශ්‍රී ලංකාවේ කෑගල්ල හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි සහල් නිෂ්පාදන වියදම් පිළිබඳ පර්යේෂණ වාර්තාව.
3. කෘෂිකර්මාන්තය තුළ ජෛව තාක්ෂණය භාවිතය පිළිබඳ වාර්තාව.
4. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී වගාව පිළිබඳ වාර්තාව.
5. වාර්ෂික වාර්තාව 2004. (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි)
6. මාසික ආහාර ද්‍රව්‍ය විවරණිකාව.
7. සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව.

තවද, "ගොවි ජනතා" සඟරාවෙහි කලාප දෙකක් හා "පුවත් හසුන" හි කලාප දෙකක් ද ඒකකය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර සතිපතා "ආහාර ද්‍රව්‍ය විවරණිකාවෙහි" සංස්කරණ කටයුතු ද සිදු කරන ලදි. "Sri Lanka Journal of Agrarian Studies" සහ "ගොවි කටයුතු අධ්‍යයන" යන ශාස්ත්‍රීය සඟරා සංස්කරණ කටයුතු නිමකර, 2007 වර්ෂයේ මුල් භාගයේ දී මුද්‍රණය කිරීම සඳහා කටයුතු සූදානම් කොට තිබුණි. "Who's Who at HARTI" යනුවෙන් ආයතනයේ කාර්ය මණ්ඩලයට අදාළ ජීව දත්ත තොරතුරු ඇතුළත් ප්‍රකාශනයක් ද ඒකකය මඟින් නිකුත් කර ඇත.

නිම කළ අධ්‍යයනයන්

1. මාතලේ දිස්ත්‍රික්කයේ කෘෂි-ව්‍යාපෘති ව්‍යවසායකත්ව සංවර්ධන සහාය ව්‍යාපෘතිය (EDAP) : ග්‍රාමීය කෘෂි ව්‍යවසායකයන් සහ නියෝජිතයන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (RABDA) 2005-2006

පර්යේෂණ කණ්ඩායම

ආචාර්ය ඩී. තෙන්නකෝන්	- අධි පර්යේෂක
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	- ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

දත්ත රැස්කිරීම

එන්.එස්.ඩබ්. නවරත්න මහතා	- සංඛ්‍යාන නිලධාරී

මූල්‍යමය දායකත්වය	මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය (REAP)
ව්‍යාපෘතියට පදනම් වූ කලාපය	මාතලේ දිස්ත්‍රික්කය
මූල්‍ය ප්‍රතිපාදන	රු: මිලියන 1.8

සුළු පරිමාණ ගොවීන් හට කෘෂි සේවාවන් සැපයීම හා කෘෂි යෙදවුම් ව්‍යාප්තිය ශක්තිමත් කිරීම සඳහා පුද්ගලික අංශයේ දායකත්වය තවදුරටත් දිරි ගැන්වීමේ අභිලාෂයෙන් මෙම RABDA වැඩසටහන සැලසුම් කරන ලදි. මෙහි පළමු වටය 2002 වර්ෂයේ ආරම්භ කොට 2004 වර්ෂයේ අවසන් කළ අතර පළමු වටය යටතේ මාතලේ දිස්ත්‍රික්කය තුළ නියෝජිතයන් 22 ක් පුහුණු කොට ස්ථාපනය කරන ලදි. පළමු වටය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබූ සාර්ථකත්වය මත, මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය මඟින් 2005-2006 දක්වා කාලය තුළ මෙහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ලබා දුන් අතර, එම අදියර යටතේ නියෝජිතයන් 20 දෙනෙකු පුහුණු කොට ස්ථාපනය කරන ලදි. දෙවන අදියර තුළින් ව්‍යාපෘතියේ අවධානය යොමු වූයේ, එවකට ක්‍රියාත්මක වෙමින් පැවති වැඩසටහන (2002-2004 කාලයෙහි ස්ථාපිත) ශක්තිමත් කිරීම සහ දේශීය මට්ටමින් කෘෂි යෙදවුම් සපයන්නා වූ නුපුහුණු ව්‍යවසායකයන් පුහුණු කිරීම තුළින් ව්‍යවසායකත්වය උසස් කිරීමයි.

දේශීය කෘෂි ව්‍යාප්ති ව්‍යවසායකත්වය හඳුන්වාදීම තුළින් කුඩා පරිමාණ ගොවීන්හට විශ්වසනීය සහ සහතික කළ හැකි මට්ටමේ කෘෂිකාර්මික සේවාවන් හා යෙදවුම් ලබා ගැනීමේ හැකියාව දියුණු කිරීම මෙම ව්‍යාපෘතියෙහි ඉලක්කය විය.

ක්‍රියාත්මක වෙමින් පවතින අධ්‍යයනයන්

1. වර්ෂාපෝෂිත උස්බිම් වගාව ආශ්‍රිත කෘෂිකාර්මික හා ව්‍යාප්ති සේවා ගැටලු හඳුනා ගැනීම පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම

ආචාර්ය ඩී. තෙන්නකෝන්	-	අධි පර්යේෂක
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
එච්.එම්.ජේ.කේ. හේරත් මහතා	-	පර්යේෂණ නිලධාරී
ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා	-	පර්යේෂණ නිලධාරී
ටී.පී. සෝමරත්න මහතා	-	පර්යේෂණ නිලධාරී

දත්ත රැස්කිරීම

එන්.එස්.ඩබ්. නවරත්න මහතා	-	සංඛ්‍යාන නිලධාරී

මූල්‍යමය දායකත්වය	කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP)
අධ්‍යයන කලාපය	අනුරාධපුරය, කුරුණෑගල, මාතලේ සහ මොණරාගල දිස්ත්‍රික්ක
මූල්‍ය ප්‍රතිපාදන	රු: 534,000/-

අධ්‍යයනයේ අරමුණු
පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වන්නේ

- නියඟය කළමනාකරණය කර ගැනීම, භෝග නිෂ්පාදනය, වැසි ජලය කළමනාකරණය සහ දැනුම ව්‍යාප්ත කිරීම යන ක්ෂේත්‍රයන්ට අදාළව ශ්‍රී ලංකාව තුළ යෝජිත පර්යේෂණ හා තාක්ෂණ උත්පාදන ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම.
- වර්ෂාපෝෂිත උස්බිම් සහ වියළි බිම්වල වගාවන් සඳහා වැඩි දියුණු කළ තාක්ෂණික ක්‍රම තෝරා ගැනීමේ හා භාවිතා කිරීමේ ප්‍රමිතීන් පිළිබඳව අධ්‍යයනය කිරීම.
- නියඟයෙන් පීඩිත ප්‍රදේශයන්හි ගොවීන් අතර වර්ෂාපෝෂිත උස්බිම් හා වියළි බිම් සඳහා වැඩි දියුණු කළ වගා ක්‍රම භාවිතයේ දී ඇතිවන ගැටළු පිළිබඳ විමර්ශනය කිරීම.
- අධ්‍යයන කලාපයන්හි, දේශීය සහාය සේවාවන් මඟින් භාවිතා කරන ව්‍යාප්ති සේවා සහ තාක්ෂණය මාරු කිරීමේ ක්‍රම ද ඇතුළුව කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම.

පර්යේෂණ ව්‍යාපෘතිය 2005 ජුනි මස ආරම්භ කරන ලද අතර 2007 ජුනි මස දක්වා පවත්වාගෙන යාමට නියමිතය. අධ්‍යයනයට අදාළ දත්ත රැස් කිරීමේ කටයුතු 2006 දෙසැම්බර් මස වන විට සම්පූර්ණ කරන ලද අතර දත්ත වගු ගත කිරීම සහ පිරිසැකසුම ක්‍රියාත්මක වෙමින් පවතී. අවසාන වාර්තාව 2007 ජූලි මස වන විට සම්පූර්ණ කිරීමට නියමිතය.

2. කෘෂි භෝග විවරණිකාව - 2005

පර්යේෂණ කණ්ඩායම

ආචාර්ය පී.එම්. ජේනේගෙදර	-	අංශ ප්‍රධාන
ආචාර්ය එම්.එස්. සේනානායක	-	අංශ ප්‍රධාන (කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය)
එම්.එම්.එම්. අහියර් මහතා	-	සහාය අධි පර්යේෂක
ආචාර්ය ඩබ්.ඩී. වික්‍රමසිංහ	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී
බී.එච්.ඒ. ශාන්ත මහතා	-	පර්යේෂණ නිලධාරී
රුවිනි විදානපතිරණ මහත්මිය	-	පර්යේෂණ නිලධාරිනී
කේ.ඩී.එස්. ආරියසිංහ මහතා	-	දත්ත විශ්ලේෂක
ඊ.එන්.ආර්. ප්‍රනාන්දු මහතා	-	දත්ත විශ්ලේෂක
එම්.ඩී.එල්. සෙනරත් මහතා	-	ජ්‍යේෂ්ඨ ක්‍රම විශ්ලේෂක/වැඩසටහන් සම්පාදක

මූල්‍යමය දායකත්වය   හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
මූල්‍ය ප්‍රතිපාදන   රු: 110,000/-

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ, ප්‍රධාන කෘෂි ආහාර ද්‍රව්‍යන්හි කාලානුරූප දත්ත විශ්ලේෂණය කිරීම මඟින් රටෙහි ආහාර නිෂ්පාදනය හා ආහාර සුරක්ෂිතභාවය සඳහා ප්‍රතිපත්ති තීරණ ගැනීමට දායක වීම හා එහි වැදගත්කම හඳුනාගැනීමයි. එමෙන්ම රටෙහි වර්තමාන හා අනාගත ආහාර අවශ්‍යතාවයන්ට අනුකූලව අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ දී ඇතිවන බාධාවන් හා විභවතාවන් හඳුනා ගැනීම ද මෙයින් අපේක්ෂා කෙරේ. මෙහි විශේෂිත අරමුණ වන්නේ :

(අ) වී, බඩ ඉරිඟු, කුරක්කන්, කව්පි, මුං ඇට, උඳු සෝයා බෝංචි, ලොකු ළූණු, රතු ළූණු, අර්තාපල්, මඤ්ඤොක්කා, බතල, තල, රටකජු යන ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්හි වපසරිය, නිෂ්පාදනය හා අලෙවි ප්‍රවණතා පිළිබඳ සමාලෝචනය කිරීම.
(ආ) ඉහත භෝගවලට අදාළ සංඛ්‍යාත්මක තොරතුරු පිළියෙල කිරීම (Crop Profiles).
(ඇ) ඉහත භෝග වර්ග ප්‍රවර්ධනය, නිෂ්පාදනය හා අලෙවිය සඳහා ස්ථාපිත රාජ්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම.
(ඈ) ප්‍රතිපත්ති සම්පාදකයන් හා වෙනත් පාර්ශවයන් අතර තොරතුරු ව්‍යාප්ත කිරීම.

3. කෘෂිකාර්මික පැතිකඩ - 2005 *(Agricultural Profile)*

ව්‍යාපෘති කණ්ඩායම

ආචාර්ය පී.එම්. ජේනේගෙදර	-	අංශ ප්‍රධාන
ඊ.එන්.ආර්. ප්‍රනාන්දු මහතා	-	දත්ත විශ්ලේෂක
එම්.ඩී.එල්. සෙනරත් මහතා	-	ජ්‍යේෂ්ඨ ක්‍රම විශ්ලේෂක/වැඩසටහන් සම්පාදක
එන්.පී. ජයනෙත්ති මහත්මිය	-	දත්ත සහකාර

මූල්‍යමය දායකත්වය   හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
මූල්‍ය ප්‍රතිපාදන   රු: 50,000

ප්‍රධාන ධාන්‍ය භෝගයන් හි වපසරිය හා නිෂ්පාදනය, ඒවායේ නිෂ්පාදන පිරිවැය, පශු සම්පත්, ආනයන හා අපනයන දත්ත සහ අලෙවි තොරතුරු යනා දි කෘෂිකාර්මික හා ගොවි කටයුතු දත්තයන් එක් රැස් කිරීම තුළින් මෙම කෘෂිකාර්මික පැතිකඩ 2005 පිළියෙල කොට තිබේ. සංඛ්‍යාත්මක විවරණිකාවන් ලෙස, ප්‍රධාන කෘෂිකාර්මික ද්‍රව්‍යයන්ගේ වපසරිය, නිෂ්පාදනය, ආනයන දත්ත සහ පරිභෝජනය ආදිය පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් ය.

මෙහි ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භෝග අංශයෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ පහසුවෙන් පරිශීලනය කළ හැකි සංඛ්‍යාන අත්පොතක් ලෙස එළි දැක්වීමයි.

මෑත කාලීන තොරතුරු ඇතුළත් මෙම ලේඛණය, පුළුල් පරාසයක විහිදී සිටින කෘෂිකාර්මික සංවර්ධන අංශයෙහි නියුතු වූවන් සඳහා වැදගත් වේ.

ඒ අනුව :

(අ) ප්‍රතිපත්ති සම්පාදකයන් හා ව්‍යාපෘති සම්පාදකයන් හට සිය සැලසුම් අවශ්‍යතාවයන්හි දි නිවැරදි තීරණ ගැනීම සඳහා ද,
(ආ) අධ්‍යයනයන්හි නිරතවූවන්ට හා විශ්ව විද්‍යාල සිසුන්ට සිය පර්යේෂණ කාර්යයන් හා උසස් අධ්‍යාපන කටයුතුවලට අදාළ නිබන්ධන සඳහා ද,
(ඇ) ගොවි මහතුන්ට වගාවෙන් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි පරිදි වගා කටයුතු සැලසුම් කිරීම සඳහාත්
(ඈ) පුද්ගලික අංශයේ නියැළී සිටින වෙනත් උනන්දුවන පාර්ශවයන්ගේ විවිධ වූ දත්ත අවශ්‍යතා සපුරාලීම සඳහා ද මෙය වැදගත් වේ.

වෙනත් කටයුතු

ප්‍රසිද්ධ දේශන මාලාව - සම්බන්ධීකාරක - ආචාර්ය පී.එම්. හේනෙගෙදර
ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාජ-ආර්ථික හා සංවර්ධන කරුණුවලට අදාළව පහත දැක්වෙන දේශනයන් අදාළ කාලය තුළ සංවිධානය කරන ලදි.

1. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ මහාචාර්ය කාලිංග ටියුඩර් සිල්වා විසින් පවත්වන ලද "ග්‍රාමීය ශ්‍රී ලංකාවේ දිළිඳු භාවයෙහි සමාජීය ලක්ෂණ හා එහි අනාරක්ෂිත බව" පිළිබඳ වූ දේශනය.
2. "ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන සාර්ව ආර්ථික අරමුණු පිළිබඳව" ශ්‍රී ලංකා මහ බැංකුවේ, ආර්ථික පර්යේෂණ අංශයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය පී.එන්. වීරසිංහ විසින් පවත්වන ලද දේශනය.
3. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ඒ.එස්. චන්ද්‍රබෝස් විසින්, "ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයෙහි තිරසර බව" පිළිබඳව පවත්වන ලද දේශනය.
4. පොල් පර්යේෂණ ආයතනයේ, ප්‍රධාන සංඛ්‍යානඥ, ආචාර්ය ටී.එස්.ජී. පීරිස් විසින් ශ්‍රී ලංකාවේ පොල් වගාවේ අනාරක්ෂිත බව කෙරෙහි දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම ඇගයීම පිළිබඳ දේශනය.
5. "ශ්‍රී ලංකාව කෙරෙහි ලෝක බැංකු සංවිධානයේ කෘෂිකාර්මික ගනුදෙනුවල බලපෑම හා අපගේ ගනුදෙනු වල තත්ත්වය" පිළිබඳව, කෘෂි අපනයන දෙපාර්තමේන්තුවේ, ජ්‍යෙෂ්ඨ කෘෂි ආර්ථික විද්‍යාඥ, ආචාර්ය අනුර හේරත් විසින් පවත්වන ලද දේශනය.
6. "ශ්‍රී ලංකාව තුළ සහභාගිත්ව සංකල්පයන්හි වලංගුභාවය" පිළිබඳව අන්තර් මාධ්‍ය තාක්ෂණ ආයතනයේ, ආපදා කළමනාකරණ වැඩසටහනෙහි කණ්ඩායම් ප්‍රධාන, රණසිංහ පෙරේරා මහතා විසින් පවත්වන ලද දේශනය.
7. රුහුණු විශ්ව විද්‍යාලයේ, කෘෂි ආර්ථික විද්‍යා අංශයේ, මහාචාර්ය මංගල ද සොයිසා විසින් පවත්වන ලද "ග්‍රාමීය මූල්‍යමය අලෙවි ප්‍රවණතා" පිළිබඳවූ, දේශනය.
8. "සංවර්ධනයේදී ආපදා පිළිබඳ අවදානම සහ අභියෝග" යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි උපදේශක මාධවී ආරියබන්දු මහත්මිය විසින් පවත්වන ලද දේශනය.

මානව සම්පත් සංවර්ධන සහ ආයතනික සංවර්ධන අංශය

මානව සම්පත් සංවර්ධන සහ ආයතනික සංවර්ධන අංශය ප්‍රධාන කාර්යයන් තුනක් ඔස්සේ ක්‍රියාත්මක වේ. ඉන් පළමු වැන්න වන්නේ ජාතික අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිද්දෙන් මානව සම්පත් සංවර්ධන සහ ආයතනික සංවර්ධන අංශය මඟින්ම නොකඩවා සංවිධානය සහ සම්බන්ධීකරණය කරණු ලබන පුහුණු වැඩසටහන් හා ඒ සම්බන්ධ වෙනත් කාර්යයන්ය. දෙවෙනුව වෙනත් ආයතනවල ඉල්ලීම පරිදි විශේෂිත වූ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම මෙන්ම පැවැත්වීමද සිදු කරනු ලබයි. තෙවෙනුව වෙනත් ආයතන මගින් සංවිධානය කරණු ලබන පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍යතාවයන් සහ සම්පත් දායකයන් වශයෙන් සේවය ලබාදීම ද මෙම අංශය මඟින් සිදු කරණු ලබයි. මෙයට අමතරව අයතනයේ අනෙකුත් පර්යේෂණ අංශ මගින් කරගෙන යනු ලබන පර්යේෂණ කටයුතු සඳහාද, මානව සම්පත් සංවර්ධන සහ ආයතනික සංවර්ධන අංශයේ පර්යේෂණ නිලධාරීන්ගේ දායකත්වය ලබා දෙනු ඇත.

කෙටිකාලින පුහුණු වැඩසටහන්, වැඩමුළු මෙන්ම සම්මන්ත්‍රණ ද හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සංවිධානය කරණු ලබයි. මෙම සියලු වැඩසටහන් සඳහා සම්පත් දායකයන් වශයෙන් බොහෝ විට කටයුතු කරණු ලබන්නේ ආයතනයේ පර්යේෂණ ප්‍රජාවය. ඒ හැරුණ විට විශේෂ අවශ්‍යතාවයන් මත විශ්ව විද්‍යාල වලින් ද, රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන ආයතනවලින් ද සම්පත් දායකයින් ගේ සේවය ලබාගැනිමට කටයුතු කරනු ලැබේ.

නිම කරණ ලද පුහුණු වැඩසටහන්

1. ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳව පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන (ගම නැගුම වැඩ සටහන යටතේ පවත්වන ලද කෙතට අරුණ පුහුණු වැඩසටහන).

   සම්බන්ධීකරණය - ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා - අංශ ප්‍රධාන

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි උක්ත පුහුණු වැඩසටහන 2006 පෙබරවාරි සහ මාර්තු යන මාසවලදී පැවැත්වීමට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය එකඟ විය. රජයේ "ගම නැගුම" වැඩ සටහන යටතේ ග්‍රාමීය ප්‍රදේශයන්හි තිරසාර සංවර්ධනයක් ඇති කිරීම පිණිස කෘෂිකර්මාන්තය පදනම් කරගත් ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීම මෙන්ම හැකියාවක් ලබාදීමද අමාත්‍යාංශයේ බලාපොරොත්තුව විය. පුහුණු වැඩසටහනේ මූලික තේමාව වූයේ "කෙතට අරුණ" යන්නය. පුහුණු වැඩසටහනෙහි මූලික පරමාර්ථය වූයේ සහභාගිත්ව සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳව සංකල්ප හා ක්‍රම විධි පිළිබඳව සහභාගි වන්නන්ගේ දැනුම වර්ධනය කරීමයි. ඊට අමතරව ග්‍රාමීය සංවර්ධන සැලැසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය හා ව්‍යාපෘති චක්‍ර කළමනාකරණය වැනි සහභාගිත්ව ක්‍රම විධි යොදා ගැනීම පිළිබඳ සහභාගිවන්නන්ගේ හැකියාවන් වර්ධනය කිරීමත් මෙහිදී බලාපොරොත්තු විය.

මෙම අරමුණ සපුරා ගැනීම සඳහා දින 04 ක පුහුණු වැඩ සටහනක් සැලසුම් කෙරිණි. එවැනි වැඩ සටහන් 04 ක් පවත්වන ලද අතර ඉන් එකක් අඟුණුකොලපැලැස්සේද, තවත් වැඩසටහනක් ගන්නොරුවේද, වැඩ සටහන් දෙකක් මහඉලුප්පල්ලම පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද සේවා සංස්කරණ අභ්‍යාස ආයතනවලදී පවත්වන ලදී.

පුහුණු වැඩසටහන්වල නිමැවුම වූයේ සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය උපයෝගි කර ගනිමින් ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට හැකි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 100ක පිරිසක් බිහිවීමය. එයට අමතරව ක්ෂේත්‍ර කාර්යයන් සඳහා තෝරාගත් ගම් 8ක් සඳහා කෘෂිකාර්මික සංවර්ධනය පිණිස සකස් කරනු ලැබූ ආදර්ශ සැලසුම් 8ක් මෙහිදී සකස් කෙරිනි. මෙම ආදර්ශ සැලසුම් 8 මෙන්ම ඊට අමතරව එම ක්ෂේත්‍ර අධ්‍යයන පැවැති ගම්වලින් ලබාගන්නා ලද අනිකුත් දත්ත සහ තොරතුරු ද උපයෝගි කර ගනිමින් වාර්තා 8ක් ආයතනය විසින් සකස් කරන ලදී. මෙම වාර්තා පිටපත් පුහුණු වැඩ සටහන් සඳහා සහභාගි වූ සියලුම නිලධාරීන්ට මෙන්ම කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන්ටද මතු ප්‍රයෝජනය සඳහා ලබා දීමට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කටයුතු කරන ලදී.

2. MS Access සහ SPSS යන පරිඝනක මෘදුකාංග පිළිබඳව පුහුණු පාඨමාලාව

සම්බන්ධීකරණය ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා - අංශ ප්‍රධාන
සම්පත්දායක එම්.ඩී.එල්. සෙනරත් මහතා - ජ්‍යෙෂ්ඨ ක්‍රම විශ්ලේෂක/ වැඩසටහන් සම්පාදක

මෙම පුහුණු වැඩ සටහන සකස් කරන ලද්දේ ආයතනයේ පර්යේෂණ නිළධාරීන් සඳහායි. වැඩසටහන 2006 ජුනි මස පළමු සතියේදී මෙම වැඩ සටහන ආරම්භ කරන ලද අතර එකී වසරේ නොවැම්බර් මස දී අවසන් කරන ලදි. මෙම පුහුණු වැඩසටහනෙහි මූලික පරමාර්ථය වූයේ ඉහත සඳහන් පරිඝනක මෘදුකාංග භාවිතා කරමින් දත්ත සකස් කිරීම මෙන්ම දත්ත පදනම උපයෝගි කරගනිමින් දත්ත සටහන් (වගු) නිර්මාණය කිරීමටත්, ඒවා භාවිතා කරමින් වාර්තා සැකසීමටත් අවශ්‍ය මූලික දැනුම පර්යේෂණ ප්‍රජාව වෙත ලබාදීමයි. මෙම පුහුණු වැඩසටහනේදී සමාජ ආර්ථික පර්යේෂණවල දී සාමාන්‍යයෙන් භාවිතා කරනු ලබන සංඛ්‍යාන විශ්ලේෂක ක්‍රම ගැන මෙන්ම විශේෂයෙන් ආයතනය විසින් එකතු කරනු ලබන ක්ෂේත්‍ර දත්තයන් විශ්ලේෂණය කිරීම පිළිබඳවද අවධානය යොමු කරන ලදි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂකයින් 23 දෙනෙකු මෙම පුහුණු වැඩසටහන සඳහා සහභාගි විය. පාඨමාලාව ප්‍රධාන අංශ 3 කින් සමන්විත විය. පළමු වැන්න දත්ත, දත්ත පදනම් සහ දත්ත පදනම් කළමනාකරණය කිරීම පිළිබඳව හඳුන්වා දීමයි. දෙවැන්න MS ACCESS මෘදුකාංගය යොදා ගනිමින් දත්ත පදනම් කළමනාකරණය කිරීමයි. තෙවැනි අංගය වූයේ SPSS මෘදුකාංගය යොදාගෙන දත්ත විශ්ලේෂණය කරන ආකාරය පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමයි.

වැඩසටහනෙහි නිමවුම වූයේ MS Access සහ SPSS පරිඝනක මෘදුකාංග යොදා ගනිමින් දත්ත පදනමක් කළමනාකරණය කිරීමට හැකි පර්යේෂකයින් 23 දෙනෙකු ආයතනය තුළින් බිහිවීමයි.

3. ග්‍රාමීය සංවර්ධනය සඳහා තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන භාවිතා කිරීම සම්බන්ධ අන්තර් ජාතික පුහුණු වැඩසටහන 2006 නොවැම්බර් මස 14 සිට නොවැම්බර් 23 වැනි දින දක්වා

සම්බන්ධීකාරක - ආර්.ද සිල්වා මහත්මිය - ලේඛකාධිකාරිණී

ඉන්දියානු ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනය (NIRD) සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා ආසියානු පැසිෆික් කලාපීය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය (CIRDAP) සම්බන්ධ වී මෙම පුහුණු වැඩමුළුව අප ආයතනයේ දී පවත්වන ලදී.

මෙම වැඩසටහන CIRDAP සාමාජික රටවල් 14 (ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, ලාඕසය, මියන්මාරය, නේපාලය, පාකිස්ථානය, පිලිපීනය, තායිලන්තය, වියට්නාමය, ඉරානය, ශ්‍රී ලංකාව) නියෝජනය කරමින් 26 දෙනෙක් සහභාගි වූහ. විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය ගරු තිස්ස විතාරණ මැතිතුමා මෙහි සමාරම්භක උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය.

මෙම වැඩසටහනේ අන්තර් ජාලය හා පර්යේෂණ, සංවර්ධන වැඩසටහන් සමීක්ෂණය සඳහා යොදා ගැනීම, කාන්තාවන් බලගැන්වීම් සඳහා ඉලෙක්ට්‍රොනික් තොරතුරු තාක්ෂණය යොදා ගැනීම, ග්‍රාමීය පාලනය චන්ද්‍රිකා තාක්ෂණය භාවිතය (SATCOM) ඉඩම් වාර්තා තබා ගැනීම හා ලියාපදිංචි කිරීම, භූ විද්‍යාත්මක දත්ත සහ කෘෂිකර්මය සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය යන කරුණු අන්තර්ගත විය. මීට අමතරව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය උදෙසා තොරතුරු තාක්ෂණය හා සංනිවේදන ක්‍රම යොදා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දැක බලා ගැනීමට ක්ෂේත්‍ර චාරිකා ද සුදානම් කරන ලදී. මේ අනුව මෙම කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පිටකන්ද ගම, ගැම්දිරිය පදනම හා උඩුතුල්ල ගම්මානවලට ගොස් අදාල ක්‍රියාකාරකම් පිළිබඳව අත්දැකීම් ලබා ගන්නා ලදී.

4. ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය මගින් සංවිධානය කරන ලද සුනාමියට ගොදුරු වූ ප්‍රදේශ නැවත ගොඩනැගීමේ ව්‍යාපෘතිය යටතේ එම ප්‍රදේශවල ප්‍රජා නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාව.

සම්බන්ධීකරණය -ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා - අංශ ප්‍රධාන

2006 ජුනි මසදී ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනයේ (කලින් අන්තර් මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය - ITDG) ඉල්ලීම පරිදි ඉහත සඳහන් පුහුණු වැඩ සටහන් මාලාව පවත්වා ගෙන යෑම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය එකඟ විය. ග්‍රාමීය ප්‍රදේශයන්හි තිරසාර සංවර්ධනය සඳහා යොදා ගැනීමට සුදුසු වන්නාවූ උචිත තාක්ෂණය පිළිබඳව එම ප්‍රදේශයන්හි ප්‍රජා නායකයන් දැනුවත් කිරීම මෙම වැඩසටහන තුළින් ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය බලාපොරොත්තු විය. පුහුණු වැඩසටහන් මාලාවෙහි මූලික අන්තර්ගතය වූයේ පරිසර සංවේදීතාවය, සංවර්ධනයේදී කාන්තා සහභාගිත්වයේ ඇති වැදගත්කම හා ජීවන මාර්ග සැලසුම් කර ගැනීම යන කරුණුය.

ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනයේ ඉහත සඳහන් වූ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2006 සැප්තැම්බර් මස සිට 2006 දෙසැම්බර් මස දක්වා කාලය තුළ අම්පාර, පුත්තලම, හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රජා නායකයින් සඳහා එක් දින පුහුණු වැඩසටහන් 50ක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වන ලදී. මේ වැඩසටහන් මාලාව සඳහා ඇස්තමේන්තු වියදම රුපියල් 4,590,052.00 ක මුදලක් ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට ලබා දෙන ලදී.

පුහුණු වැඩසටහන් නිමැවුම වූයේ අදාළ දිස්ත්‍රික්කයන්හි ප්‍රජා නායකයින් 2,500 ක පිරිසක් සාකච්ඡා කරන ලද විෂයයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමයි.

5. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ඉදිරි පස් වසර සඳහා පර්යේෂණ හා පුහුණු වැඩ සටහන් මාලාව සකස් කිරීමේ වැඩමුළුව

සම්බන්ධීකරණය - ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා - අංශ ප්‍රධාන

2005 වසරේදී නව රජය ආරම්භවූ පසු නව කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් සකස් කරන ලදී. එම නිසා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කටයුතු මෙන්ම පුහුණු කිරීම් ද නව කෘෂිකාර්මික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි සකස් කළ යුතු විය. පර්යේෂණ හා පුහුණු කිරීමේ කටයුතු සැලසුම් කිරීමේදී "මහින්ද චින්තනය" යටතේ යෝජිත කාර්යභාරයන් කෙරෙහි ද මූලිකත්වයක් දැක්විය යුතු වන්නේය. මේ නිසා අනාගත පර්යේෂණ හා පුහුණු කටයුතු පිළිබඳව සැලසුම් සකස් කිරීම සඳහා 2006 ජනවාරි මස දී වැඩමුළුවක් පැවැත් වීමට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කටයුතු කරන ලදී.

මෙම වැඩමුළුවෙහි ප්‍රධාන අරමුණ වූයේ ඉදිරි වර්ෂ 05 සඳහා ආයතනය මඟින් කළ යුතු පර්යේෂණ හා පුහුණු කිරීම් කටයුතුවල ලේඛනයක් (කැලැන්ඩරයක්) සකස් කර ගැනීමයි. වැඩමුළුව සඳහා ආයතනයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇතුළු සියලුම පර්යේෂණ නිලධාරීහු සහභාගි වූහ. දෙදිනක් පුරා පැවැති වැඩමුළුවෙන් පසු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට වඩාත් ගැලපෙන්නා වූ පර්යේෂණ හා පුහුණු ක්ෂේත්‍ර (area) පිළිබඳව හඳුනා ගැනීමක් සිදු වුන අතර එම අංශවල ඉදිරි පස් වසර තුළ ක්‍රියාත්මක කල යුතු පර්යේෂණ හා පුහුණු වැඩසටහන් මොනවාද යන්න පෙළගැස්වීමක් සිදු විය. මෙයට අමතරව මෙහිදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පිළිබඳව "SWOT" විශ්ලේෂණයක් ද සිදු කරන ලදී.

6. ගැටුම් පවතින ප්‍රදේශ සඳහා සංවර්ධන ක්‍රමෝපායය සැකසීම යන මැයෙන් වූ වැඩමුළු මාලාව

සම්බන්ධීකරණය :

ගාමිණී කුසුම් කුමාර මහත්මිය - අධි පර්යේෂක

ව්‍යාපෘති කණ්ඩායම :

පී.ආර්. වීරක්කොඩි මහත්මිය - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී
ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා - පර්යේෂණ නිලධාරී
එස්. ඇපාසිංහ මහතා - පර්යේෂණ නිලධාරී

මූල්‍යමය දායකත්වය : ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය

අධ්‍යයනය හැඳින්වීම

වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ ගැටුම් පවතින ප්‍රදේශ සඳහා (ඉදිරි 05 වසරට) සංවර්ධන ක්‍රමෝපායයන් සැකසීමයි. ගැටුම් පවතින ප්‍රදේශ සඳහා සුවිශේෂ වූ සංවර්ධන ක්‍රමෝපායයන් සැකසීමේ අරමුණින්, අම්පාර, මඩකලපුව, මන්නාරම හා වවුනියාව යන දිස්ත්‍රික්කයන්ට 2006 සැප්තැම්බර් සිට දෙසැම්බර් යන කාල සීමාව තුළදී ඉහත සඳහන් මාතෘකාව යටතේ දිස්ත්‍රික් වැඩමුළු 4 ක් පවත්වන ලදී. අදාල දිස්ත්‍රික්කයන්හි දිසාපති, ප්‍රාදේශීය ලේකම් හෝ ඔවුන්ගේ නියෝජිතවරුන්, පළාත් පාලන ආයතනවල නියෝජිතවරුන්, දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වල නියෝජිතවරුන් ප්‍රජා සංවිධානවල නියෝජිතවරුන්, හා අදාළ දිස්ත්‍රික්කයන්හි රජයේ දෙපාර්තමේන්තු හා ආයතනවල නියෝජිතවරුන් මෙම වැඩමුළු නියෝජනය කරන ලදී. මෙම දිස්ත්‍රික් වැඩමුළුවලදී එලි දැක්වුණු කරුණු අවසාන වශයෙන් ජාතික වැඩමුළුවකදී ඉදිරිපත් කරන ලදී.

අරමුණ:

ඉදිරි පස්වසරක කාලය සඳහා අර්බුද වලින් පීඩිත ප්‍රදේශයන්ගේ සංවර්ධනයට ක්‍රමෝපායයක් සැකසීම

නිගමන:

නැගෙනහිර පළාතේ අම්පාර හා මඩකලපුව යන දිස්ත්‍රික්ක හා උතුරු පළාතේ වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්ක නියෝජනය කරමින් අදාල දිස්ත්‍රික් වැඩමුළුවලට සහභාගි වූ ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සංවර්ධනය උදෙසා දායකවූවන් විසින් මෙම ප්‍රයත්නයේ නියැලිනි. .සංවර්ධනය හා ගැටුම්, පිළිබඳ න්‍යායාත්මක අවබෝධයක් ලබාගත් නියෝජිතවරුන් ගැටුම් මැද සංවර්ධනයට දායක වීමේදී අදාළ ප්‍රදේශ තුල හා ඉන් පරිබාහිරව කාලීන හා ස්ථානමය වශයෙන් උද්ගත වූ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් තම ප්‍රදේශයන්හි සංවර්ධන ගැටළු හා අවශ්‍යතා ප්‍රමුඛතා ගත කර දිස්ත්‍රික්ක සතර සඳහා වෙන් වෙන් වශයෙන් සංවර්ධන උපාය මාර්ග සකස් කරන ලදී. මෙම සංවර්ධන උපාය මාර්ග සැකසීමේදී සහභාගිත්වයේ ඒකායන බලාපොරොත්තුව වූයේ එක් එක් දිස්ත්‍රික්කයන් තම සංවර්ධන අරමුණු කරා ළඟා වීමේදී භෞතික හා මිනිස් සම්පත් ලබා ගැනීමේ පහසුවත් ඊට උචිත පරිසරයක් පවත්වා ගැනීමත් අත්‍යවශ්‍ය බවයි.

සෙසු ක්‍රියාකාරකම්

ඡායාරූප සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණ කටයුතු.

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය මඟින් ආයතනයේ පර්යේෂණ කටයුතු මෙන්ම පුහුණු කටයුතුවලට අදාළ ඡායාරූප මෙන්ම ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණයන් සකස් කිරීම සිදු කරනු ලබයි. ආයතනයට අමතරව ආයතනයේ සම්මන්ත්‍රණශාලාවන්හි පැවැත්වෙන වෙනත් ආයතනවල වැඩමුළු/සම්මන්ත්‍රණ ආදිය සඳහා ද ඒ අයගේ අවශ්‍යතාවයන් අනුව මෙම සේවය ලබාදෙනු ලැබේ. ආයතනය මඟින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වැඩසටහන් මෙන්ම පර්යේෂණ කටයුතුවල විවිධ අවස්ථා ද ඡායාරූප ගත කිරීම මෙන්ම අවශ්‍ය පරිදි ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණයන් සකස් කිරීම මෙමගින් සිදුවේ.

2006 වසර තුළදී "උඩවලව කිරි ගව ගැටළුව" පිළිබඳව විනාඩි 20 ක වීඩියෝ පටයක් නිර්මාණය කරල ලදී. ඒ හැරුණ විට නොවැම්බර් මාසයේදී ඒකදාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා පැසිපික් කලාපීය (CIRDAP) ආයතනයේ අනුග්‍රහය මත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ආසියානු කලාපීය පුහුණු වැඩසටහනේ ශ්‍රව්‍ය දෘෂ්‍ය ආවරණය ද මෙම අංශය මඟින් කරන ලදී.

කාර්ය මණ්ඩල තත්ත්වයන්

	2005.12.31 දිනට තත්ත්වය	වසර තුළ සේවය අස්වීම් හෝ ඉල්ලා අස්වීම	පත්වීම්	2006.12.31 දිනට තත්ත්වය
අධ්‍යක්ෂ	1	-	-	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ	1	-	-	1
අංශ ප්‍රධාන	6	-	-	6
පර්යේෂණ කාර්ය මණ්ඩලය	29	2	-	27
පරිපාලන කාර්ය මණ්ඩලය	5	1	-	4
පුස්තකාලය - ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	2	-	-	2
දත්ත සංවර්ධන ඒකකය	2	-	-	2
පරිඝනක ඒකකය	2	-	-	2
ප්‍රකාශන ඒකකය	2	-	-	2
සංඛ්‍යාන කාර්ය මණ්ඩලය	25	-	-	25
තාක්ෂණ කාර්ය මණ්ඩලය	1	-	-	1
ලිපිකාර, ලේකම් කටයුතු හා සමාන්තර ශ්‍රේණි	51	2	-	49
ක්‍රියාකරවන්නන් සහ ආශ්‍රිත ශ්‍රේණි	39	3	-	36
සම්පූර්ණ සංඛ්‍යාව	166	8	-	158

කාර්ය මණ්ඩල සංවර්ධනය

පහත සඳහන් පර්යේෂණ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යනයන්හි යෙදී සිටියහ.

එල්.පී. රූපසේන මහතා - ඉන්දියාවේ කෘෂි විද්‍යා විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධිය

ඩී.පී. කරුණාරත්න මහතා - එක්සත් රාජධානියේ, ස්වභාවික සම්පත් තිරසාර පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යන ඩිප්ලෝමාව/ විද්‍යාපති උපාධිය.

එන්.පී.ජී. සමන්ත මහතා - පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා - පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මහත්මිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2006.12.31 දිනට ශේෂ පත්‍රය

		2006		2005	
වත්කම්	සටහන	රු.	රු	රු.	රු.
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත හා උපකරණ	2	26,390,241.68		24,033,876.62	
ආයෝජන ස්ථාවර තැන්පතු	3	5,389,096.12		5,311,134.13	
භාණ්ඩාගාර බිල්පත්		4,372,095.10		4,372,095.10	
කාර්ය මණ්ඩල සුභසාධනය	4	17,953,192.49		17,553,195.07	
එකතුව			54,104,625.39		51,270,300.92
ජංගම වත්කම්					
තොග	5	2,919,244.48		2,769,595.64	
ණය අරමුදල		2,481,323.64		2,152,342.93	
ණයගැතියෝ	6	30,467,154.13		31,583,190.75	
තැන්පතු	7	612,070.00		662,070.00	
ඉදිරි ගෙවීම් හා ලැබිය යුතු ගෙවීම්	8	258,616.29		251,965.16	
අත්තිකාරම්	9	352,035.48		1,900,507.39	
බැංකු ශේෂ	10	11,335,674.55		4,042,459.56	
අතැති මුදල්		10,000.00		10,000.00	
එකතුව			48,436.118.57		43,372,131.43
මුළු වත්කම්			102,540,743.96		94,642,432.35
හිමිකම් හා වගකීම්					
ප්‍රාග්ධන සහ සංචිත					
රජයේ මුලධන ප්‍රධානය	11	98,355,900.00		90,855,900.00	
ඉතිරි කිරීම්වල දායකත්වය		1,102,372.79		1,102,372.79	
අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන දීමනා		2,342,835.00		2,342,835.00	
ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල	12	14,757,706.09		14,757,706.09	
ප්‍රාග්ධන සංචිත		3,242,284.40		3,242,284.40	
ව්‍යාපෘති පොදු සංචිත	13	16,524,437.47		16,524,437.47	
දිරි දීමනා අරමුදල		137,061.91		137,061.91	
දිරිදීමනා අරමුදල - ව්‍යාපෘති		138,210.72		138,210.72	
පුහුණු අරමුදල - ව්‍යාපෘති		396,261.91		396,261.91	
දිරිදීමනා අරමුදල ආයතනයේ කොටස		501,835.86		501,835.86	
ශුද්ධ ඌනතාවය ඉදිරියට ගෙනගියා	14	(75,789,105.48)		(66,004,808.88)	
එකතුව			61,709,800.67		63,994,097.27
වගකීම්					
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික වෙන් කිරීම්		27,999,536.69		20,322,465.00	
			27,999,536.69		20,322,465.00
ජංගම වගකීම්					
ණය හිමියෝ	15	5,157,980.23		4,637,084.77	
ගෙවිය යුතු ණය		2,481,323.64		2,155,082.38	
උපචිත වියදම්		5,192,102.73		3,533,702.93	
එකතුව			12,831,406.60		10,325,870.08
මුළු හිමිකම් හා වගකීම්			102,540,743.96		94,642,432.35

....

සභාපති අධ්‍යක්ෂ ගණකාධිකාරිණි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

2006 දෙසැම්බර් 31 වැනි දිනට ආදායම් හා වියදම් ගිණුම්

	සටහන	2006 රු.	2005 රු.
ආදායම මහාභාණ්ඩාගාරයෙන් ලද අරමුදල		64,140,000.00	52,000,000.00
නේවාසිකාගාර හා සම්මන්ත්‍රණ ශාලා පහසුකම්	16	5,561,987.98	4,142,995.80
ප්‍රකාශන අලෙවිය		184,685.25	150,824.05
ආයෝජන පොළිය		653,234.12	437,682.44
කාර්ය මණ්ඩල ණය පොළිය		630,455.75	879,524.89
ව්‍යාපෘති පුනරාවර්තන දායකත්වය	17	2,484,884.70	906,830.19
විවිධ ආදායම්	18	772,122.22	690,576.00
		74,427,370.02	**59,208,433.37**
වියදම			
පරිපාලන හා ආයතන වියදම්	19	(84,235,168.15)	(70,595,985.72)
බොල් ණය ඌණ වෙන් කිරීම		46,501.53	
මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම්වලින් ශුද්ධ ආදායම		**(9,761,296.60)**	**(11,387,552.35)**
මූල්‍ය පිරිවැය		(23,000.00)	(20,226.83)
බදුවලට පෙර ශුද්ධ හිඟය		**(9,784,296.60)**	**(11,407,779.18)**
බදු			
බදුවලින් පසු අතිවිශේෂ අයිතම්වලට පෙර ශුද්ධ ආදායම		**(9,784,296.60)**	**(11,407,779.18)**
අති විශේෂ අයිතම		-	
ආදායම ඉක්මවූ වියදම		**(9,784,296.60)**	**(11,407,779.18)**

....

සභාපති අධ්‍යක්ෂ ගණකාධිකාරිණී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
2006.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2006 රුපියල්	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය ලැබීම්			
වර්ෂය සඳහා ශුද්ධ හිඟය			(9,784,296.60)
ගැලපීම්			
ක්ෂයවීම් සඳහා		3,383,935.67	
ආයෝජන ආදායම		(653,234.12)	
පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්		8,677,405.90	
පාරිතෝෂිත ගෙවීම්		(1,000,334.21)	10,407,773.24
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය			623,476.64
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
තොග වැඩිවීම		(149,648.84)	
ණයගැතියන් අඩුවීම		1,116,036.62	
තැන්පතු අඩුවීම		50,000.00	
ඉදිරිගෙවීම් හා ලැබිය යුතු ගිණුම් වැඩිවීම		(6,651.13)	
අත්තිකාරම් අඩුවීම		1,548,471.91	
ණයහිමියන් වැඩිවීම		518,156.01	
උපචිත වියදම් වැඩිවීම		1,658,399.80	4,734,764.37
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ශුද්ධ මුදල්			5,358,241.01
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය			
දේපල යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම්		(5,740,300.73)	
ස්ථාවර තැන්පතු		(77,961.99)	
පොළී ලැබීම්		653,234.12	
කාර්ය මණ්ඩල සංවර්ධන වියදම්		(399,997.42)	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය			(5,565,026.02)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ			
රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රතිපාදනය		7,500,000.00	
ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල			
දිරිගැන්වීමේ දීමනා අරමුදල ආයතන කොටස		-	
මූල්‍ය ක්‍රියාකාරම් තුළින් ශුද්ධ මුදල්			7,500,000.00
මුදල් සහ මුදල් සමාන අනිකුත් අයිතම්වල ශුද්ධ වැඩිවීම්			7,293,214.99
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන අයිතම්	*I*		13,735,688.79
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන අයිතම්	*II*		21,028,903.78

සටහන

මුදල් හා මුදල් හා සමාන අයිතම්	1 2006.01.01	11 2006.12.31
ආයෝජන ස්ථාවර තැන්පතු	5,311,134.13	5,311,134.13
භාණ්ඩාගාර බිල්පත්	4,372,095.10	4,372,095.10
බැංකු ශේෂය	4,042,459.56	11,335,674.55
අතැති මුදල්	10,000.00	10,000.00
එකතුව	13,735,688.79	21,028,903.78

2006 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා හිමිකම් වෙනස් වීම් ප්‍රකාශනය

	රජය ප්‍රදානය කළ මූලධනය රු.	ඉතුරුම්වල දායකත්වය රු.	අමාත්‍යාංශයෙන් ලද මූලධන දායකත්වය රු.	ව්‍යාපෘතියෙහි මූලධන අරමුදල් රු.	මූලධන සංචිතය රු.	ව්‍යාපෘති සාමාන්‍ය සංචිතය රු.	දිරි දීමනා අරමුදල් රු.	දිරි දීමනා අරමුදල් ව්‍යාපෘති රු.	පුහුණු අරමුදල් ව්‍යාපෘතිය රු.	දිරිදීමනා අරමුදල් ආයතනයේ කොටස රු.	සමුච්චිත ආදායම රු.	එකතුව රු.
2006.01.01 දිනට ශේෂය	90,855,900.00	1,102,372.79	2,342,835.00	14,757,706.09	3,242,284.40	16,524,437.47	137,061.91	138,210.72	396,261.91	501,835.86	(66,004,808.88)	63,994,097.27
මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්	7,500,000.00	-	-	-	-	-	-	-	-			7,500,000.00
ව්‍යාපෘති දායකත්වය	-	-	-	-	-	-	-	-	-	-	-	
ආදායම සහ වියදම	-	-	-	-	-	-	-	-	-	-	(9,784,296.60)	(9,784,296.60)
එකතුව	98,355,900.00	1,102,372.79	2,342,835.00	14,757,706.09	3,242,284.40	16,524,437.47	137,061.91	138,210.72	396,261.91	501,835.86	(75,789,105.48)	61,709,800.67

මූල්‍ය වාර්තාව පිළිබඳ සටහන්
2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ගිණුම් ප්‍රතිපත්ති
1.1 පොදු

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැයට අනුව පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා අදාළ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

1.2 වත්කම් අගය කිරීම්

i දේපල පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශේෂපත්‍රයේ දක්වා ඇත. සරල මාර්ග ක්‍රමය යටතේ එක් එක් වත්කම් සඳහා වාර්ෂික ක්ෂය අනුපාත පහත පරිදි වේ.

ඉඩම්	ක්ෂයවීමක් නැත
ගොඩනැගිලි	වසරකට 2 1/2%
උපකරණ/ලී බඩු	වසරකට 10%
පරිඝනක	වසරකට 20%
සුහසාධන උපකරණ	වසරකට 10%
පොත්	වසරකට 5%
වාහන	වසරකට 20%

මිලදී ගන්නා වසරේදී මුළු වර්ෂය වෙනුවෙන් ක්ෂයවීම් කරනු ලැබේ. නඩත්තුව හා අලුත්වැඩියාව වියදම් හැටියට දක්වා ඇත. ප්‍රධාන වශයෙන් වෙනස් කිරීම් ප්‍රාග්ධනයට ඇතුළත් කර ඇත. වත්කම්වල නඩත්තු සහ අලුත්වැඩියා වර්ෂයේ වියදම් ලෙස සලකන අතර, ප්‍රධාන වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනගත කරනු ලැබේ.

ii ණයගැතියෝ
බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කර ඇත. මෙම වාර්තාව සකසන විට පැවති මුළු ණය මුදලින් 4%ක් අඩමාන ණය ලෙස සලකා ප්‍රතිපාදනය සලසා ඇත. ණය ගැතියන් උපලබ්ධි විය හැකි වටිනාකම අනුව දක්වා ඇත. ගිණුම්වල බොල් හා අඩමාන ණය වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීම් සිදුකර ඇත. අඩමාන ණය වෙන්කිරීම් මුළු ණයගැතියන්ගෙන් 4% වේ.

iii තොග
පාරිභෝජන ද්‍රව්‍ය තොග පිරිවැය මත අගය කර ඇත. අනෙකුත් තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු වටිනාකම අගය කර ඇත. තොග පිරිවැය පළමුව ලැබීම් පළමුව නිකුත් කිරීම් ක්‍රමය මත අගය කර ඇත.

1.3 පාරිතෝෂිකය

1983 අංක 12 දරණ සේවක පාරිතෝෂික ආඥා පනතෙහි විධිවිධානවලට අනුකූලව පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයෙහි ප්‍රතිපාදන සලසා ඇත.

1.4 ආදායම් හා වියදම් ගිණුම

වියදමට වඩා අදායම (ආදායමට වඩා වියදම) ගණනය කරන ලද්දේ,

(අ) ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් අනාගතයේදී දැරීමට සිදුවන සියලුම වියදම් සහ බොල් හා අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමෙන් හා ආයතනයේ සැලසුම් හා උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමෙන්ද,

(ආ) වර්ෂය තුළ පැනනැගී ඇති සියලුම වියදම් සැලකිල්ලට ගැනීමෙන්ද අනතුරුවය.

වත්කම් ක්ෂයවීම් සඳහා ලැයිස්තුව - 2006

විස්තරය	2006.01.01 දිනට පිරිවැය	පෙර වර්ෂවල ගැලපුම්	2006 වර්ෂය තුල මිලදී ගැනුම් සහ ඉවත් කිරීම් රු.	2006.12.31 දිනට මුළු පිරිවැය රු.	2006.01.01 දිනට සමුච්චිත ක්ෂය රු.	2006 වර්ෂය සඳහා ක්ෂය රු.	2006.12.31 දිනට සමුච්චිත ක්ෂය රු.	2006.12.31 දිනට ශුද්ධ අගය රු.
ඉඩම්	1,716,667.00	-	-	1,716,667.00	-	-	-	1,716,667.00
ගොඩනැඟිලි	16,481,889.52	-	1,839,627.20	18,321,516.72	7,563,658.58	458,037.92	8,021,696.50	10,299,820.22
උපකරණ/ලි බඩු	28,270,305.15	(291,100.00)	1,853,801.90	29,833,007.05	21,135,653.80	1,413,485.80	22,549,139.60	7,283,867.45
පරිඝනක	14,571,509.47	287,500.00	1,408,667.40	16,267,676.87	12,985,661.55	1,132,655.98	14,118,317.53	2,149,359.34
මෝටර් රථ	8,293,855.88	-	-	8,293,855.88	8,293,806.88	-	8,293,806.88	49.00
පොත්	7,757,892.14	-	641,804.23	8,399,696.37	3,079,462.73	379,755.97	3,459,218.70	4,940,477.67
සුභසාධන උපකරණ	3,734.55	-	-	3,734.55	3,733.55		3,733.55	1.00
ව්‍යාපෘති	-	3,600.00	-	3,600.00	-			
මුළු එකතුව	**77,095,853.71**	**-**	**5,743,900.73**	**82,836,154.44**	**53,061,977.09**	**3,383,935.67**	**56,445,912.76**	**26,390,241.68**

සටහන්

		2006.12.31
3.	හෙ.කො.ගො.ප.පු. ආයෝජන - ස්ථාවර තැන්පතු	
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතු	3,500,000.00
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතු (නිවාස ණය ක්‍රමය)	1,889,096.12
		5,389,096.12
4.	කාර්ය මණ්ඩල සංවර්ධනය	
	2006.01.01 දිනට ශේෂය	17,553,195.07
	වසර තුළදී කරන ලද ගැලපීම්	399,997.42
		17,953,192.49
5.	තොගය	
	ප්‍රකාශන හා සඟරා	775,154.40
	ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් පරිභෝජනය කළ හැකිදේ	1,709,926.08
	අලෙවි සැල	434,164.00
		2,919,244.48
6.	ණය ගැතියෝ	
	කාර්ය මණ්ඩල ණය ගැතියෝ	
	නිවාස ණය	2,193,043.15
	ඒකාබද්ධ ණය	16,366,825.45
	උත්සව අත්තිකාරම්	102,710.00
	අවතැන් වූ පුද්ගලයින්ගෙන් අයවිය යුතු	6,723.32
	වැටුප් අත්තිකාරම්	1,669,916.20
	ශිෂ්‍යත්ව ලාභීන්ගේ ණය	16,708,897.35
		37,048,115.47
	වෙනත් ණය ගැතියෝ	
	කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු	409,715.35
	නේවාසිකාගාර සහ ශ්‍රවණාගාර / සම්මන්ත්‍රණශාලා	229,835.00
	භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබිය යුතු පොලිය	161,886.95
	ලැබිය යුතු ආයෝජන ආදායම්	880,265.55
	ජනශක්ති රක්‍ෂණය	4,837.68
	වෛද්‍ය පහසුකම්වලින් ලැබිය යුතු	218.81
	විවිධ ණය ගැතියෝ	256,811.24
	සේවාස්ථ පුහුණු ආයතනයෙන් ලැබිය යුතු	6,806.38
	කේ.එන්.යූ. ගුණසේකර ගෙන් ලැබිය යුතු	12,100.00
	කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු	297,941.97
	ඉවත් වූ සේවකයින්ගෙන් ලැබිය යුතු	102,339.82
	අලෙවි සැල	50,923.75
	සුභ සාධක සංගමය	37,797.31
		2,451,479.81
	ව්‍යාපෘති අත්තිකාරම්	
	ආර් - 288 කෘෂි ද්‍රව්‍ය ලබා දීමේ ව්‍යවසායකත්ව සංවර්ධන සහයක ව්‍යාපෘතිය	160,976.25
	ආර් - 237 කෘෂිකර්ම කෞතුකාගාරය	323,580.78

ආර් - 239 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටු දැකීමේ ක්‍රියාබද්ධ පර්යේෂණ වැඩසටහන	51,016.47
ශ්‍රී ලංකාවේ එළවළු අලෙවිකරණ විශ්ලේෂණය	159,975.15
ආර් - 199 NIRP යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක වැඩ සටහන ඇස්තමේන්තුව	179,229.29
ජී -18 කිතුල් ව්‍යාපෘතිය	16,987.51
ජී - 2 කොළ පැහැති තේ දළු නිෂ්පාදන වියදම් සහ තේ සැකසුම් පිළිබඳ අධ්‍යයනය	9,261.37
ආර් - 97 දේශීය ධීවර කර්මාන්තය	116,910.99
ආර් - 256 බිත්තර හා ගෘහාශ්‍රිත මස් අලෙවිකරණය	32,575.34
ආර් - 171 එන්.ඩබ්.පී. ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	48,872.32
ආර් - 330 ශක්‍යතා අධ්‍යනය කුරුඳු වත්ත යෝජිත ආර්ථික මධ්‍යස්ථාන	33,588.76
ආර් - 331 ආහාරමය වැදගත්කමක් ඇති ගස් හෙළීම (පාලන) පණත යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් පනවා ඇති නියමයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමීක්ෂණය	8,681.23
පහළ ඌව ව්‍යාපෘතියෙහි පර්යේෂණ මැදිහත්වීම ආර් - 112	61779.85
ආර් - 118 මහවැලිය යටතේ ගොවිපොළ ප්‍රමාණය සහ කාර්යක්ෂමතාවය	66,268.32
ආර් - 129 වැඩකරන දිළිඳු ජනතාව සඳහා ග්‍රාමීය කර්මාන්ත අංශයෙහි රැකියා සහ ආදායම් වැඩි දියුණු කිරීම	27,089.34
ආර් - 146 ගොවිජන ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය සංවර්ධන යාන්ත්‍රණය සඳහා පසු විපරම සහ ඇගයීම වර්ධනය කිරීම	41,947.56
ආර් - 175 ග්‍රාමීය සංවර්ධනයේ අන්තර්ගතයක හැටියට පශු සම්පත් පිළිබඳ අනුගාමී ක්‍රියාකාරකම්	10,062.64
ආර් - 183 ශ්‍රී ලංකාවේ ශීත ගබඩා සංකීර්ණයක් පිහිටුවීම පිළිබඳ උපදේශනය	24,328.81
ආර් - 186 කෘෂිකර්ම බෙදාහැරීම් පද්ධතිය ශක්තිමත් කිරීමට ඒකාබද්ධ වැඩසටහනක් සකස් කිරීම	427,276.42
ආර් - 194 මී ගව තොරතුරු වාර්තා ගත කිරීමේ ව්‍යාපෘතිය	8,444.79
ආර් - 232 කඳුකර සහ වර්ෂා පෝෂිත ප්‍රදේශවල ඒකාබද්ධ ජල කළමනාකරණය ඇති කිරීම සඳහා ගොවි සමාගම් ඇති කිරීම පිළිබඳ පුහුණු අත්පොත	26,801.54
ආර් - 264 වාණිජකරණයේ දී කෘෂිකාර්මික ව්‍යාප්ති විභවතා සහ බාධක හඳුනාගැනීම	12,600.00
ආර්- 266 ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාවය සංවර්ධනය සඳහා තිරසාර කෘෂිකාර්මික පුරුදු ප්‍රවර්ධනය	87,352.00
ආර් - 270 ගම්පහ දිස්ත්‍රික්කයේ කොස් ශාකය වැවිලි බෝගයක් ලෙස ඵලදායිතාවය සහ භාවිතය පිළිබඳ සමීක්ෂණය	64,985.10
ජාතික විද්‍යා පදනමෙන් ලැබිය යුතු	49,100.00
සර්ඩැප් ලැබිය යුතු	173,694.59
ආර් - 288 කාලාපීය ආර්ථික අභිවර්ධන ව්‍යාපෘතිය	124,843.55
ආර් - 312 ගොවි සමාගම් පිළිබඳ අධ්‍යයනය	71,421.81
ටී - 226 ප්‍රජා මූලික නායකයන් පිළිබඳව නිර්මාණාත්මක දැනුවත් කිරීම පිළිබඳ පණිවිඩ පිළිබඳ වැඩසටහන	448,513.29
ටී - 228 අර්බුද පවතින ප්‍රදේශයන්හි සංවර්ධන වැඩ සඳහා ක්‍රමෝපායයන් පිළිබඳ වැඩමුළුව	752,382.89
	3,620,547.96
මුළු ණය ගැතියෝ	43,120,143.24
අඩු කළා:	
බොල් සහ අඩමාන ණය වෙන්කිරීම්	(1,724,805.73)
ණය හිමියන් (බැඳුම්කර) වෙන්කිරීම්	(110,373.69)
ශිෂ්‍යත්ව සඳහා වෙන්කිරීම	(10,817,809.69)
	30,467,154.13

7. තැන්පතු

ස්ථාවර - භෝජනාගාර හිමිකරු	20,000.00
ස්ථාවර - මුදල් අයකැමි	1,500.00
විවිධ - ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ	147,500.00
විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්)	3,125.00
විවිධ - තැපැල්පති	24,945.00
විවිධ - කොළඹ ගෑස් හා ජල සමාගම	4,750.00
විවිධ - ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය	500.00
විවිධ - සෙල්ටෙල් ලංකා	3,500.00
විවිධ - ලංකා විදුලිබල මණ්ඩලය	406,250.00
	612,070.00

8. ඉදිරි ගෙවීම් හා ලැබියයුතු මුදල්

ඉදිරි ගෙවීම්	258,616.29
	258,616.29

9. අත්තිකාරම්

මිලදී ගැනීම් සඳහා අත්තිකාරම්	61,378.01
වෙනත් දේ සඳහා අත්තිකාරම්	290,657.47
	352,035.48

10. බැංකුවෙහි ඇති මුදල්

ලංකා බැංකුව ගිණුම් අංකය - 2323293	4,494,885.62
ලංකා බැංකුව ගිණුම් අංකය - 2323292	3,921,695.76
ලංකා බැංකුව ගිණුම් අංකය - 2323317	1,243,802.51
ලංකා බැංකුව ගිණුම් අංකය - 2323315	1,675,290.66
	11,335,674.55

11. රජයේ ප්‍රාග්ධන ප්‍රදාන

2006.01.01 දිනට ශේෂය	90,855,900.00
වර්ෂය තුළ ප්‍රාග්ධන යෙදවුම්	7,500.000.00
	98,355,900.00

12. ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල

2006.01.01 දිනට ශේෂය	14,757,706.09
වසර තුළදී එකතු කිරීම්	-
	14,757,706.09

13. ව්‍යාපෘති සාමාන්‍ය සංචිතය

2006.01.01 දිනට ශේෂය	16,524,437.47
වසර තුළදී එකතු කිරීම්	-
	16,524,437.47

14. ශුද්ධ හිගය

2006.01.01 දිනට ශේෂය	(66,004,808.88)
2006. වර්ෂය සඳහා ආදායම ඉක්මවූ වියදම	(9,784,296.60)
	(75,789,105.48)

15. ණය හිමියන්

ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	93,067.20
නොගෙවූ වියදම්	9,302.24
සේවක හා භෝජනාගාර තැන්පතු	13,084.50
වෙනත් ණය හිමියන්	545,758.00
ව්‍යාපෘතිවල ණය හිමියෝ	
ආර් - 300 සමෘද්ධි හා සමෘද්ධි නොවන සන්සන්දනාත්මක විශ්ලේෂණයක්	234,998.50
ආර් - 292 කෘෂිකාර්මික තොරතුරු මධ්‍යස්ථානය	4,801.11
සහල් නිෂ්පාදනය පිළිබඳ ග්‍රන්ථය	1,782,451.82
මැතිවරණ දෙපාර්තමේන්තුව	77,704.41
ආර් - 318 ආහාර අනාරක්ෂිතභාවය හා එයට නැඹුරුවීමේ ඇති අවදානම පිළිබඳ තොරතුරු එකතු කිරීමේ හා සිතියම්ගත කිරීමේ ක්‍රියාවලිය	890,765.79
ටී - 294 ආහාර අනාරක්ෂිතභාවය හා එයට නැඹුරුවීමේ ඇති අවදානම පිළිබඳ තොරතුරු එකතු කිරීමේ හා සිතියම්ගත කිරීමේ ක්‍රියාවලිය	890.765.79
ජී - 15 ග්‍රාම සංවර්ධන සැලසුම් සූදානම් කිරීම පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීම	2,120.83
ජී - 13 ගෘහාශ්‍රිත මට්ටමේ සහල් සැකසුම් ක්‍රියාවලියේ ආර්ථික සාධ්‍යතාවය	31,382.80
ආයතන භෝජනාගාරය පවත්වාගෙන යන අය	18,941.40
රැකියාවෙන් ඉවත්වූ සේවක ගෙවීම්	174,401.89
ආර් - 322 වාරියපොල ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයන යෝජනා වලිය	26,119.08
ආර් - 332 බස්නාහිර පළාතේ පොළ වෙළඳපොළ වර්ධනය කිරීමේ අධ්‍යයනය	368,000.00
ආර් - 187 එස්.සී.ඕ.ආර් ව්‍යාපෘතිය සඳහා ක්‍රියාවලි වාර්තාගත කිරීම පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය	50,006.71
ශ්‍රී ලංකාවේ ගිවිසි ගොවිපොල විභවතා සහ වෙළඳපොළ මැදිහත් වීමේ ගැටළු	43,464.00
ආර් - 297 දකුණු ආසියාවේ තෝරාගත් රටවල් කිහිපයක ආහාරවල ව්‍යුහය	16,235.82
ආර් - 321 උඩවලව ජාතික උද්‍යානයේ කිරිගව ගැටළුව අධ්‍යයනය	32,677.84
ආර් - 326 ගම නැඟුම වැඩසටහන යටතේ තෝරාගත් ගම්මාන දහයක් සංවර්ධනය සඳහා වන මූලික සමීක්ෂණය	81.00
ආර් - 295 ජල සම්පත කළමනාකරණ ප්‍රතිපත්තිය	160,544.81
ආර් - 290 තිරසාර ගම්මාන සංවර්ධනය	191,666.12
ටී -225 එම්.එස් ඇක්සෙස් / එස්පීඑස්එස් පුහුණු පාඨමාලාව	24,500.00
ආර් - 291 සමෘද්ධි කළමනාකරුවන් පුහුණුව	107,222.69
ටී - 223 ප්‍රජා මූලිකත්ව සංවිධානයන්හි නායකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	213.00
උපතිස්ස - භෝජනාගාර හිමිකරු	40,521.80
	5,157,980.23

16 ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා හා නේවාසිකාගාර ආදායම

ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණශාලා ආදායම	3,276,341.00
නේවාසිකාගාර ආදායම	2,285,646.98
	5,561,987.98

17. ව්‍යාපෘති ආදායම්

පරිපාලන පිරිවැය	
ව්‍යාපෘතිවල දායකත්වය	2,484,884.70
	2,484,884.70

18 විවිධ ආදායම්

බංගලා ගාස්තු හා කාමර කුලී	36,033.00
පැල්වෙහෙර කාමර කුලී	16,800.00
පරිඝනක ආදායම	26,442.76
ටෙන්ඩර් ගාස්තු	1,500.00
වෙනත් ආදායම්	691,346.46
	772,122.22

19 පරිපාලන සහ ආයතන වියදම්

ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම්	34,982,489.55
අනියම් කාර්ය මණ්ඩල වැටුප්	2,959,023.82
සේවක අර්ථසාධක අරමුදල	4,661,271.27
සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල	941,121.94
අතිකාල	1,265,259.06
නිවාඩු දින ගෙවීම්	14,267.90
තේ දීමනා	352,920.00
වෙනත් දීමනා	5,903,482.90
පාරිතෝෂික	8,677,405.90
ජීවන වියදම	2,512,216.93
සංයුක්ත දීමනා	296,735.58
ප්‍රවාහන වියදම්	223,341.75
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	337,750.33
වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය	499,645.18
ඉන්ධන සහ ලිහිසි තෙල්	882,029.71
නිල ඇඳුම්	32,033.64
වාහන අළුත් වැඩියා	2,021,085.75
යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා	714,039.60
ක්ෂයවීම්	3,383,935.67
ගොඩනැඟිලි අළුත්වැඩියා	437,709.47
දුරකථන ගාස්තු	1,631,018.59
විදුලිය	2,746,458.72
ජල බිල්පත්	265,810.62
වරිපනම් සහ බදු	197,460.00
තැපැල් ගාස්තු	226,233.50
ප්‍රවාහනය	174,250.00
නීති උපදේශක	110,000.00
පරිඝනක උපදේශක	66,000.00
වාහන උපදේශක	22,000.00
පුවත්පත්	131,444.67
බලපත්‍ර සහ රක්ෂණය	410,093.14
ආරක්ෂක ගාස්තු	1,015,341.47
පිරිසිදු කිරීමේ ගාස්තු	259,332.88
රෙදි සේදීම	233,160.00
විගණන ගාස්තු	106,000.00
වෛද්‍ය රක්ෂණ	175,328.81
ආපනශාලා ගාස්තු	136,700.00
විවිධ වියදම් - පර්යේෂණ	3,392,335.93
විවිධ වියදම් - වෙනත්	1,265,040.33
නෛතික ගාස්තු	223,375.60

සුභ සාධන	100,000.00
දැන්වීම්	44,188.75
සම්මුඛ පරීක්ෂණ ගාස්තු	4,800.00
පාලක මණ්ඩලය	176,000.00
සංග්‍රහ	21,152.00
රඳවා ගැනීමේ ගාස්තු/මුද්දර ගාස්තු	3,877.19
	84,235,168.15

20. වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන අයිතම්

ආයෝජන - ස්ථාවර තැන්පතු	5,311,134.13
භාණ්ඩාගාර බිල්පත්	4,372,095.10
බැංකු ශේෂය	4,042,459.56
අතැති මුදල්	10,000.00
	13,735,688.79

21. වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන අයිතම්

ආයෝජන - ස්ථාවර තැන්පතු	5,311,134.13
භාණ්ඩාගාර බිල්පත්	4,372,095.10
බැංකු ශේෂය	11,335,674.55
අතැති මුදල්	10,000.00
	21,028,903.78

සභාපති,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ
2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව
1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී ආයතනයේ සභාපතිවරයා වෙත නිකුත් කරනු ලැබේ.

1.2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත් හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශයනයන්හි දැක්වෙන අගය සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීම හා යොදා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසුද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශය

2.1 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2006 දෙසැම්බර් 31 දිනට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත්වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමඟ දී ඇති සටහන් වලට (අංක 1 සිට 21 දක්වා) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 ප්‍රකාර ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනාගෙන ක්ෂය කළ යුතු වුවත්, වාහන හැර සියලුම වත්කම් එක් ඒකකයක් ලෙස ක්ෂයකර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත දැක්වේ.

(අ) ලිපිද්‍රව්‍ය, වාරසඟරා, සහ විකුණුම් කවුළුවේ තොගය ඇතුලත් අවසාන තොගය භෞතික ශේෂයට අවශ්‍ය ගැලපීම් සිදු නොකර පොත් අගයට වූ හෙයින් රු.400,027 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත ඌනතාවය රු.400,027 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) ශිෂ්‍යත්ව ණයගැතියන් රු.10,765,916 කින් අඩුවෙන් දැක්විණි.

2.2.3 භර ශේෂයන් ඇතුළු හඳුනා නොගත් ගනුදෙනු එකතුව රු.22,698ක විස්තර කිසිවක් නොමැතිව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම ගිණුම්වල පැවති පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

	විෂයය	වටිනාකම		ඉදිරිපත් නොවූ සාක්ෂි
අ)	ස්ථාවර වත්කම්	රු.	72,825,631	විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණ
ආ)	විවිධ ණය ගැතියෝ	රු.	17,039,097	කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ කිරීම
	විවිධ ණය හිමියෝ	රු.	555,060	
ඇ)	විවිධ ආදායම්	රු.	69,134	
	වැටුප් අත්තිකාරම්	රු.	1,669,916	විස්තරාත්මක උපලේඛණ සහ කාල විශ්ලේෂණ
	විවිධ විදයම් - පර්යේෂණ	රු.	3,392,336	
	විවිධ වියදම් - අනෙකුත්	රු.	1,265,040	
ඈ)	මිලදී ගැනීම් අත්තිකාරම්	රු.	1,096,993	භාණ්ඩ ලැබීම් පත්‍රිකාව

2.2.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථාවන් නිරීක්ෂණය විය.

	නීති රීති රෙගුලාසි ආදියට යොමුව	විස්තර
අ)	1971 අංක 38 දරණ මුදල් පනතේ 13(8) වගන්තිය	මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර 2004 හා 2005 වර්ෂයන්හි වාර්තාවලින් පෙන්නුම් කරන ලද කරුණු සම්බන්ධයෙන් ගත් පියවර හෝ ගැනීමට යෝජිත පියවර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
ආ)	1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පහත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18	ස්ථාවර වත්කම් සහ ඒ වෙනුවෙන් ක්ෂයකිරීම් පිළිබඳ විස්තරාත්මක උප ලේඛණ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.
ඇ)	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 2000 ජනවාරි 19 දිනැති අංක 380	අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන දිරිදීමනා එකතුව රු.627,698 සේවකයින්ට ගෙවා තිබුණි.
ඈ)	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 1999 ඔක්තෝබර් මස 08 දිනැති අංක 22/99	අදාළ අනුමැතිය රහිතව ආයතනයේ නිලධාරියෙකු නිල වාහන පහසුකම් ලබා ගෙන ඇත.
ඉ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛය 2001 පෙබරවාරි 06 දිනැති අංක 393	චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව මෝටර් සයිකල් දෙකක් බාහිර පාර්ශවයන්ට මුදාහැර තිබුණි.

ඊ)	භාණ්ඩාගාර චක්‍රලේඛය 1978 දෙසැම්බර් මස 19 දිනැති අංක 842	නියමිත පරිදි ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන නොමැත.
උ)	මුදල් රෙගුලාසි මු.රෙ.756	2006 වර්ෂය සඳහා වත්කම් සත්‍යාපන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
ඌ)	ආයතන සංග්‍රහය හා කාර්යාල නියෝග XXII පරිච්ඡේදයේ අංක 14:2 කාර්යාල නියෝග අංක 1545	ආයතනය විසින් පරිවාස කාලයේ සිටි ආධුනික නිලධාරීන් 06 දෙනෙකු වෙත පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි.

2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් සනාථ නොවුණු ගනුදෙනු

1994 වර්ෂයේ සිට ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.10,864,348 ක මුදලක් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් ගෙවා ඇත.

2.2.7 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරුනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

i සමාලෝචිත වර්ෂය අවසානයේ අත්තිකාරම් ඉතිරිය හා ණය ගැතියන් (ශිෂ්‍යත්ව ණය ගැතියෝ හැර) එකතුව 5,319,868 ක් විය. මෙම මුදලින් රු.3,587,577 ක මුදලක් අවුරුදු 4කට වැඩි කාලයක් තුළ හිඟව තිබුණි.

ii ආයතන සේවය හැර ගිය නිලධාරීන්ගේ රු.1,135,411 ක මුදලක් ආයතන කාර්ය මණ්ඩල ණය වශයෙන් අය කරගෙන නොතිබුණි.

iii සමාලෝචිත වර්ෂය අවසානයට ශිෂ්‍යත්ව ණය ගැතියන්ගෙන් අයවිය යුතු මුදල රු.16,708,897 ක් විය. මින් රු.16,088,897 ක් අවුරුදු 4කට වැඩි කාලයක් හිඟව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

i පිටස්තර පාර්ශවයන්ට හා ආයතනවලට අදාළ රු.5,192,103 ක වගකීම් ප්‍රමාණයක් නිරවුල් කර නොතිබුණි.

ii ව්‍යාපෘතිවලට අදාලව රු.569,140 ක මුදලක් නිරවුල් කර නොතිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ගිණුම්වලට අනුව, පුනරාවර්ථන වියදම් සඳහා රජයෙන් ලැබුණු දායකය ගණන් ගැනීමට පෙර, සමාලෝචිත වර්ෂය සඳහා රු.73,924,297 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.63,407,779 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රජයෙන් ලැබුණු රු.64,140,000 ක දායකය ගනන් ගැනීමෙන් පසුව ඉහත සඳහන් ඌනතාවය රු.9,784,297 දක්වා අඩු විය. ඉකුත් වර්ෂය සඳහා ලැබුණු රජයේ දායකය වන රු.52,000,000 ක මුදල ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු.11,407,779 දක්වා අඩුවීමෙන් මුල්‍ය ප්‍රතිඵලයේ රු.1,623,482 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

3.2 කාර්ය සාධනය

අ) කොන්ත්‍රාත් පර්යේෂණයන්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් දත්තයන් පහත සඳහන් සටහනෙහි දැක්වේ.

	2006 වර්ෂය	2005 වර්ෂය
වර්ෂය ආරම්භයේදී පැවති සංඛ්‍යාව	05	07
එකතු කළා :		
වර්ෂය තුළදී ප්‍රදානය කළ සංඛ්‍යාව	13	15
	18	22
අඩු කළා:		
වර්ෂය තුළදී සම්පූර්ණ කළ සංඛ්‍යාව	12	17
වර්ෂය අවසානයේදී අවසාන කළ යුතු සංඛ්‍යාව	06	05

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i 1992 වර්ෂයේදී ආර්ථික සහයෝගිතාවය හා පර්යේෂණ සඳහා වූ ස්විඩන් නියෝජිත ආයතන වෙතින් ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය නමැති ව්‍යාපෘතිය යටතේ ඇමරිකානු ඩොලර් 65,000 ක් ලැබී තිබුණි. 2006 දෙසැම්බර් 31 දින වන විටද මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත් රු.434,231 ක මුදලක් පශ්චාත් උපාධි වැඩ සටහනකට මෙම ව්‍යාපෘති අරමුදල්වලින් ගෙවා පසුව ප්‍රතිපූර්ණය කර තිබුණි.

ii සැලසුම් කළ ව්‍යාපෘති යෝජනා 08ක් සම්පත්දායක ආයතන වෙත ඉදිරිපත් කර ඉන් ව්‍යාපෘති යෝජනා 2කට පමණක් මුදල් ලබා දීම අනුමත කර තිබුණි.

iii 2006 ක්‍රියාකාරී සැලසුම අනුව එම වසරේ පැවැත්වීමට යෝජනා කර තිබූ පුහුණු වැඩසටහන් 06ක් පවත්වා නොතිබුණි.

ආ) පර්යේෂණ වාර්ෂික ප්‍රගතිය හා ප්‍රකාශන අංශයේ නිකුත් කළ ප්‍රකාශන අනුව එම අංශයේ ඉලක්ක කරා ළඟා වී නොතිබුණි.

2006 සඳහා ඉලක්ක ගත ප්‍රකාශන	-	40
නිකුත් කරන ලද ප්‍රකාශන	-	15
හිඟය	-	25

3.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජන වත්කම්

පහත සඳහන් ඌන හා උපයෝජන වත්කම් නිරීක්ෂණය කර ඇත.

උපයෝජන වත්කම්	සඳහන් වටිනාකම	නිෂ්ක්‍රිය කාලය	නිෂ්ක්‍රිය වීමට හේතු
අ) රථවාහන - 04	730,068	අවු.3ට වැඩි	තදබල අලුත්වැඩියාව
ආ) යතුරුපැදි -21	1,525,900	අවු.3ට වැඩි	තදබල අලුත්වැඩියාව
ඇ) වාර්ෂික වාර්තා හා ප්‍රකාශන	428,625	අවු.4ට වැඩි	නොවිකිණීම

3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අ) පැල්වෙහෙර සංචාරක බංගලාවේ භාරකාරත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ) අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ ක්‍රියාකාරීත්වයේ පවතින මෝටර් රථ 05 ක් ආයතනය පවරාගෙන නොතිබුණි.

ඇ) ණය උපයෝගී කර ගෙන ලබා ගන්නා උපයෝජිත වත්කම් උකස් කිරීමේ අදාළ ලිය කියවිලි ආයතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

පහත සඳහන් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

අ) අත්තිකාරම් ගෙවීම සහ නිරවුල් කිරීම.

ආ) පර්යේෂණ ව්‍යාපෘති වෙතින් මුදල් මාරු කිරීම.

ඇ) වාහන අලුත්වැඩියාව.

පී.ඒ. පේමතිලක
විගණකාධිපති

AF-D-MARI - 2006